

# LGBT+ ප්‍රජාව වෙත බලපාන නීති සහ ප්‍රතිපත්ති

## මොඩියුලය 03

ශ්‍රී ලංකාවේ LGBT+ ප්‍රජාව වෙත බලපාන නීති හා ප්‍රතිපත්ති

# දළ විශ්ලේෂණය

සමානාත්මතාවය හා වෙනස්කොට නොසැලකීම යන මානව අයිතීන් ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය හා ප්‍රකාශනය, ලිංගික ලක්ෂණ (SOGIES) මත පදනම්ව උල්ලංඝනය වේ. කෙසේ වුවත්, ශ්‍රී ලංකාව තුල ද LGBTI ප්‍රජාව වෙත වෙනස් කොට සලකන නීති රීති දක්නට ඇත.

LGBTI ප්‍රජාව වෙත වෙනස් කොට සැලකීම ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ **365** සහ **365** අ යන වගන්ති මඟින් පිළිවෙලින් අස්වාභාවික වැරදී සහ පුද්ගලයින් අතර සිදුවන තදබල අශෝබන ක්‍රියාවන් ලෙස හැඳින්වේ. මෙම නීති පදනම් කරගනිමින් විවිධ දිශානතීන්ගෙන් යුත් ප්‍රජාවන් හට වෙනස්කම් සිදු කරනු ලබයි. දණ්ඩ නීති සංග්‍රහයේ **399** වන වගන්තිය වන ව්‍යාජ පුද්ගලයින් ලෙස පෙනී සිටීම" යටතේ සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව අත්අඩංගුවට ගැනීම සිදු කරනු ලබයි. පාදඩ ආඥා පනත LGBTI ප්‍රජාව හා විශේෂයෙන් ම ලිංගික වෘත්තියේ නිරතවන්නන් අත්අඩංගුවට ගැනීම සඳහා යොදා ගනු ලබයි. **1978** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **16** වන ව්‍යවස්ථාව බලයට පත් වන විටත්, සමානාත්මතාවය හා වෙනස් කොට නොසැලකීම සම්බන්ධයෙන් සියලු ලිඛිත හා ලිඛිත නොවන නීති තිබියදීත්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදුවන ලදී. එමෙන්ම නීතිය පිළිබඳව වූ අධිකරණ සමාලෝචනය ශ්‍රී ලංකා රජය විසින් පිළිනොගනී. එහි ප්‍රතිඵලයක් ලෙස LGBTI ප්‍රජාවන් හට වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් වූ නීති මාලාවන් වෙනස් කල හැක්කේ පාර්ලිමේන්තුවට පමණි. මෙම මොඩියුලය මඟින් LGBTI ප්‍රජාව වෙත සිදු වන වෙනස්කම් හා ඊට අදාල නීති සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන අතර, ලිංගික හිංසනය පිළිබඳ නීති, LGBTI පුද්ගලයින්ට හට සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් වූ නීති, ලිංගික වෘත්තිය සම්බන්ධයෙන් වූ නීති හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වූ නීති පිළිබඳව ද ඇතුලත් වේ.



## අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කරන්න:

මොඩියුල 03 සහ අනෙකුත් ලියකියවිලි සඳහා අන්තර්ජාල ගත මාර්ග ඔස්සේ ප්‍රවේශ වීමට, පහත QR කේතය ස්කෑන් කරන්න:

නැතහොත් ඔබගේ වෙබ් බ්‍රවුසරයේ පහත URL එක ටයිප් කර පිවිසෙන්න:

## www.shorturl.at/eimQY

## සැසියේ සැලසුම

**කාලය : පෙ.ව. 09.00 සිට ප.ව. 05.00 දක්වා (පැය 6ක්)**

| ආරම්භක වේලාව | වෙන් කර ඇති කාලය | සැසිය |
|---|---|---|
| **පෙ.ව. 09:00** | මිනිත්තු 15 | පෙර දින සැසිය නැවත ආවර්ජනය කිරීම / හැඳින්වීම |
| **පෙ.ව. 09.15** | මිනිත්තු 20 | සැසිය 01 : නීතිය සකස් කිරීම<br>*නීතියේ අරමුණු, නීතියේ ස්වාභාවය හා නීතියේ මූලාශ්‍ර පිළිබඳ සාකච්ඡාවක්* |
| **පෙ.ව. 09:35** | පැය 01 මිනිත්තු 40 | නීතියේ අවශ්‍යතාවය, නීතියේ ස්වභාවය, නීති මූලාශ්‍ර පිළිබඳ සාකච්ඡා කිරීම |
| **පෙ.ව. 11:15** | මිනිත්තු 15 | සැසිය 02 : ලිංගිකත්වය හා ලිංගික හිංසනය සම්බන්ධ නීති |
| **පෙ.ව. 11:30** | පැය 01 | PPT ඉදිරිපත් කිරීම සහ ප්‍රශ්න හා පිළිතුරු |
| **ප.ව. 12:30** | පැය 01 | විවේකය |
| | මිනිත්තු 30 | සැසිය 03 : ක්‍රියාකාරකම් - ලිංගිකත්වය හා ලිංගික හිංසනය සම්බන්ධ නීති |
| **ප.ව. 01:30** | මිනිත්තු 30 | ගැලපෙන ක්‍රියාකරකමක් හා සාකච්ඡාව |
| **ප.ව. 02:00** | පැය 01 | දහවල් විවේකය |
| **ප.ව. 02:30** | මිනිත්තු 15 | සැසිය 04 : LGBTI ප්‍රජාවන් හිරිහැරයට ලක් කිරීමට යොදා ගන්නා පාදඩ ආඥා පනත හා වෙනත් නීති |
| **ප.ව. 03:30** | මිනිත්තු 30 | කණ්ඩායම් සාකච්ඡාව |
| **ප.ව. 03:45** | මිනිත්තු 30 | සැසිය 05 : ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තිකයින් හා බැඳුනු නීති |
| **ප.ව. 04:15** | මිනිත්තු 15 | PPT ඉදිරිපත් කිරීම සහ ප්‍රශ්න හා පිළිතුරු |

# සැසිය 01 නීතිය සකස් කිරීම

*නීතියේ අරමුණු , නීතියේ ස්වභාවය සහ නීතියේ ඇති මූලාශ්‍ර පිළිබඳ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීම*

## කාලය

මිනිත්තු 20

## ඉලක්කගත කණ්ඩායම

එක් සැසියකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30 කට පමණ

## අරමුණු

සහභාගී වන්නන්ට සැසිය අවසානයේදී

- නීතිය යනු මිනිසුන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මිනිසා විසින් සකස් කරන ලද පද්ධතියක් බව තේරුම් ගැනීමට,
- නීතිය කාලයත් සමඟ, සන්දර්භයක් තුල වෙනස් වන බව හා වෙනස් කල හැකි බව තෙරුම් ගැනීමට
- නීතියේ මූලාශ්‍ර හඳුනා ගැනීමට හැකියාව ලැබෙනු ඇත..

## අවශ්‍ය උපකරණ

- සෑම කණ්ඩායමක් සඳහාම කඩදාසි හා පෑන්
- සහභාගී වන්නන් හට මඟ පෙන්වීම සඳහා (දණ්ඩ නීති සංග්‍රහය, සිවිල් හා අපරාධ නීති සංග්‍රහය, අධිකරණ නීති සම්බන්ධ මූලාශ්‍ර) යනාදී මූලාශ්‍ර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්

## සූදානම් වීම

- ස්ලයිඩ්ස්

## පියවර

- අපගේ උපත හා මරණය යන දෙකම ලියාපදිංචි කිරීම සිදු කරන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම සඳහා ද නීතියක් ඇති බවත්, මිනිසුන් ලෙස අපව උපතේ සිට මරණය තෙක් රටේ පවතින නීතිය මඟින් පාලනය වන බවත් පැහැදිලි කරමින් සැසිය ආරම්භ කරන්න. රථවාහන, ආහාර සුරක්ෂිතතාවය, අධ්‍යාපනය, රැකියාව, දේපල අයිතිය සඳහා ද නීති තිබේ. නීතිය අපගේ පුද්ගලික ජීවිත වල මෙන්ම අපගේ සබඳතා සඳහා ද බලපාන බැවින් ඒ සම්බන්ධනේ දැනුවත් වී සිටීම වැදගත් වේ.
- මෙම ක්‍රියාකාරකම මගින් නීතිය පිළිබඳ මූලික සංකල්ප කිහිපයක් තේරුම් කිරීමට උත්සාහ ගන්නා බව පැහැදිලි කරන්න.
- සහභාගිවන්නන් කණ්ඩායම් 5 කට වෙන් කරන්න (දළ වශයෙන් එක් කණ්ඩායමකට සහභාගිවන්නන් 6 දෙනෙක් වන ලෙස). කණ්ඩායමේ එකිනෙකා අතර සාකච්ඡා කර පහත සඳහන් ගැටලු පහෙන් එක් ගැටලුවක් සඳහා පිළිතුරු ලබා දීමට අවස්ථාව ලබා දෙන්න:
    - ✓ නීතියක් නොතිබුණේ නම් සිදුවන්නේ කුමක්ද?
    - ✓ ඔබට නීතිය සොයා ගත හැක්කේ කොහෙන්ද?
    - ✓ නීතිය නිර්මාණය කරන්නේ කවුද?
    - ✓ අතීතයේ නීත්‍යානුකූල වූ කිසියම් ක්‍රියාකාරකමක් වර්තමාන ලෝකයේ කිසියම් අවස්ථාවක නීති විරෝධි වී ඇත්ද?
    - ✓ අතීතයේ නීත්‍යානුකූල නොවූ මුත් වර්තමාන ලෝකයේ නීත්‍යානුකූල යැයි සිතිය හැකි යම් ක්‍රියාවන් තිබේද?
- සහභාගීවන්නන් හට සාකච්ඡා කරමින් ඔවුන්ගේ සටහන් හුවමාරු කර ගන්නා ලෙස දන්වන්න.

## සාරාංශය

නීතියක් නොතිබුණේ නම් මිනීමරුම්, සොරකම් හා ස්ත්‍රී දූෂණ වැනි අපරාධ වලින් අපට ආරක්ෂා වීමට නොහැකි වන්නට පුළුවන්. එබැවින් ගැටලු සහගත තත්ත්වයන් ඇති විය හැකි අතර පුද්ගලයන්ට තම ආරක්ෂාව තනිවම සපයා ගැනීමට සිදුවනු ඇත. එවන් සමාජයක මනා ශක්‍යතාවයක් ඇති පුද්ගලයින් පමණක් සමාජය තුළ නොනැසී පවතී. එවන් ප්‍රමාණවත් ශක්‍යතාවයක් නොමැති පුද්ගලයන් හට සමාජය තුළ ආරක්ෂාවක් නොමැත. අන් අය වෙනුවෙන් පෙනී සිටිමට, නායකත්වය දැරීමට හෝ තීන්දු තීරණ ගැනීමට හැකි වන්නේ කාටදැයි ප්‍රකාශ කිරීමට හැකියාවක් නොමැත; බලය වෙනුවෙන් මිනිසුන් සටන් කරනු ඇත. තවද, කිසියම් පුද්ගලයෙක් අපගේ පවුලේ උදවිය හට කිසියම් කරදරයක් හෝ ජීවිත හානියක් සිදු කලහොත් හෝ අපගේ දෙයක් සොරකම් කලහොත් ඔවුනට දඬුවම් කිරීමට හැකියාවක් නොමැති වේ.

එම නිසා වෙනත් පුද්ගලයින්, සංවිධාන හෝ රජය මගින් මානව අයිතිවාසිකම් කඩවීමෙන් ආරක්ෂා වීම සඳහා නීතිමය පද්ධතියක් යටතේ කටයුතු කිරීමට සමාජය හුරු වී ඇත. නීතිය මගින් රජයක් විසින් ක්‍රියා කල යුතු ආකාරය සම්බන්ධයෙන් ද පැහැදිලි කරයි. නීති කඩන්නන් හට දඬුවම් පැමිණවීමට ද නීතිය ක්‍රියා කරනු ලබයි. අපරාධකරුවන් හට දඬුවම් කිරීම හා වන්දි ගෙවීම වැනි පිලියම් යෙදීම තුලින් එම අපරාධ වලට මුහුණ පෑ අය වෙනුවෙන් යුක්තිය ඉටු කිරීමට උත්සහ කරයි.
ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ප්‍රඥාප්ති, අධිකරණ පූර්වාදර්ශ හා ඇතැම් අවස්ථා වලදී සිරිත් විරිත් වැනි දෑ සලකනු ලැබේ. මූලික වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් පැහැදිලි කරන්නේ රටක් පාලනය කල යුතු ආකාරයයි. එය ආණ්ඩුවේ විවිධ ආයතනයන්හි (විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය) මූලික අයිතිවාසිකම් හා රාජ්‍ය නීති පිළිබඳ සබඳතා තහවුරු කරනු ලබයි.

ප්‍රඥාප්තිය යනු පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන ලිඛිත නීතියයි. දණ්ඩ නීති සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත ඒ සඳහා උදාහරණ වේ. (සටහන - මෙම අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා ප්‍රඥාප්තියේ පිටපත් සහභාගීවන්නන් හට බෙදා දිය හැකිය. ඒවා සැසිය අවසානයේදී ඔබට නැවත එකතු කරගත හැකිය).
ආඥා පනතක් හා පනතක් අතර වෙනස කුමක්ද? ආඥා පනතක් යනු බ්‍රිතාන්‍ය පාලන සමයේදී සම්මත කරන ලද ලිඛිත නීතියක් වන අතර, මෑතක දී සම්මත වූ නීතියක් පනතක් ලෙස හැඳින්වේ.

ඇතැම් රටවල මෙන් නොව ශ්‍රී ලංකාවේ ඇති නීතිය යල් පැන හෝ වැරදී වුවත්, විනිසුරුවරුන්ට එම නීති වෙනස් කිරීමට හෝ නිර්මාණය කිරීමට හැකියාවක් නොමැත. එසේ වුවත් මහාධිකරණ මගින් ගත් තීරණ අනුගමනය කිරීම සඳහා ඔවුන් බැඳී සිටියි. මෙය අධිකරණ පූර්වාදර්ශය ලෙස හැඳින්වේ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, ආණ්ඩුවක් බලයට පත් වන විට පැවති නීති සියල්ල නොවෙනස්ව පවතින අතර, සිරිත් විරිත් ශ්‍රී ලංකාවේ නෛතික මූලාශ්‍රයක් වන්නේ මේ ආකාරයට වේ.

ශ්‍රී ලංකාවේ නීතිය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරන්නේ පාර්ලිමේන්තුව මගිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණ වශයෙන්ම හෝ එහි ඇතුලත් ඕනෑම කොටසක් වෙනස් කිරීමට, අවලංගු කිරීමට හෝ නිර්මාණය කිරීමට බලය ඇත්තේ පාර්ලිමේන්තුවට වේ. එනමුත් ව්‍යවස්ථාවේ ඇතුලත් ඇතැම් කොටස් වෙනස් කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා ගනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් තුලිනි. ශ්‍රී ලංකාවේ සිටින සෑම වැඩිහිටි පුද්ගලයෙකුටම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දය ප්‍රකාශ කල හැකි වේ. පසුව එසේ පත් කර ගනු ලබන සාමාජිකයන් විසින් තම ආසනය නියෝජනය කරන පුරවැසියන් වෙනුවෙන් තීරණ ගනිමින් කටයුතු කල යුතු වේ. මෙය වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හඳුන්වන අතර, පුරවැසියන් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම හරහා මෙම නීති සම්පාදනය සඳහා දායක වේ.

# සැසිය 02: ලිංගිකත්වය හා ලිංගික හිංසනය පිළිබඳ නීති

***කණ්ඩායම් තුල සිටින සාමාජිකයින් විසින් දේශකයා වෙත ප්‍රශ්න ලැයිස්තුගත කර ඉදිරිපත් කරන අතර, පසුව ඔහු විසින් කෙටි දේශනයක් මගින් එම ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කරනු ලබයි.***

## කාලය

පැය 1 යි මිනිත්තු 40 යි

## ඉලක්කගත කණ්ඩායම

එක් සැසියක් සඳහා සහභාගිවන්නන් 30 දෙනෙකු පමණ

## අරමුණු

සැසිය අවසානයේදී සහභාගීවන්නන් හට;

- සමරිසි සහකරුවන්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ ලිංගික හිංසනය සම්බන්ධයෙන් වූ නීති හඳුනා ගැනීමට
- ලිංගිකත්වය / ලිංගික ක්‍රියාවන් හා ලිංගික හිංසනය අතර වෙනස හඳුනා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

## අවශ්‍ය උපකරණ

- සෑම කණ්ඩායමක් සඳහාම ෆ්ලිප්චාර්ට් කඩදාසි හා මාකර් පෑන්

## සූදානම් වීම

Slides

## ඉදිරිපත් කිරීම

PPT ස්ලයිඩ්ස්

## පියවර

- මෙම සැසියේදී ඔබ විවිධාකාර SOGIESC ඇති පුද්ගලයින්ට බලපාන නීති පිළිබඳව සහභාගීවන්නන් දැනුවත් කිරීමට උත්සාහ කරන බව පැහැදිලි කරන්න. සහභාගිවන්නන් නීති ගැන කුතුහලයෙන් සිටින බැවින් ඒ සම්බන්ධ වූ ගැටලු පෞද්ගලිකව විමසීමට වගබලාගන්න.
- සහභාගිවන්නන් කණ්ඩායම් 6 කට බෙදන්න (එක් කණ්ඩායමකට ආසන්න වශයෙන් 5 දෙනෙකු පමණ), සෑම කණ්ඩායමකටම ෆ්ලිප්චාර්ට් කඩදාසි සහ මාකර් ලබා දෙන්න
- සෑම කණ්ඩායමකටම ඔවුන්ට දැන ගැනීමට කැමති පහත සඳහන් එක් මාතෘකාවකට අදාළ ප්‍රශ්න 4 ක් සටහන් කිරීමට උපදෙස් දෙන්න. කාලය සීමා සහිත බැවින් විමසිය හැකි ගැටලු 04 කට ප්‍රමුඛතාවය ලබා දෙන්න, නමුත් ඔවුන්ට දැනගත යුතු තවත් දෑ ඇත්නම් ඔවුන්ට එම ගැටලු ද සටහන් කල හැක. මෙම අභ්‍යාසය සඳහා ඔවුන්ට විනාඩි 10 ක කාලයක් ලබා දෙන්න.
- මාතෘකා :
  1. සමරිසි පුද්ගලයන්ට බලපාන නීති
  2. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට බලපාන නීති
  3. ලිංගික හිංසනය පිළිබඳ නීති

- කණ්ඩායම් දෙකක් එකම මාතෘකාවක් යටතේ ක්‍රියා කරනු ඇත. ඔවුන් ලැයිස්තුගත කළ ප්‍රශ්න සහ එම ප්‍රශ්න ලැයිස්තුගත කළේ ඇයි ද යන්න ඉදිරිපත් කිරීමට පළමු කණ්ඩායම් දෙකට ආරාධනා කරන්න. කෙටි දේශනයෙන් පසුව ඔබ මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීමට උත්සාහ කරන බව පැහැදිලි කරන්න. PPT ස්ලයිඩ්ස් ආධාරයෙන් පළමු මාතෘකාව පිළිබඳ කෙටි දේශනයක් පවත්වන්න
- ඊළඟ කණ්ඩායම් 2 ට තම ප්‍රශ්න ඉදිරිපත් කිරීමට ආරාධනා කරන්න, මෙලෙස ඉදිරියට කරගෙන යන්න.

- ඔබ සූදානම් කර නොගත් ප්‍රශ්න තිබිය හැකි බව සලකන්න. එම ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ගැන ඔබට විශ්වාසයක් නොමැති නම් සහ ඔබේ දැනුමෙන් මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීමට ඔබට නොහැකි නම්, එම ප්‍රශ්න වලට දවස ඇතුළත ඔබ ඔවුන්ට පිළිතුර සොයා දෙන බව සහභාගිවන්නන්ට දැනුම්දෙන්න.

## සටහන්

**පහත දැක්වෙන්නේ සමරිසි පුද්ගලයන් සම්බන්ධව ඇති නීතිය පිළිබඳ කෙටි දේශනයක් සහ ඔබෙන් විමසිය හැකි ගැටලු පිළිබඳ සටහන්ය.**

### ශ්‍රී ලංකාවේ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් නීති විරෝධීද?

ශ්‍රී ලංකා තුල සමරිසි පුද්ගලයන් අතර ලිංගික සම්බන්ධතාවයන් පැවැත්වීම නීති විරෝධී වේ. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 අ යටතේ සමරිසි පුද්ගලයන් අතර ලිංගිකත්වය පිළිබඳ නීති සඳහන් වේ. අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත මඟින් 1995 දී දණ්ඩ නීති සංග්‍රහය වෙනස් කරන ලදී. මෙම වෙනස් වීමට පෙර නීතිය බලපෑවේ සමරිසි පිරිමින්ට පමණි. නීතිය ක්‍රියාත්මක වන්නේ කලාතුරකිනි. නමුත් එමඟින් රටේ LGBT+ ජනතාව නිරන්තරයෙන් පහත්කොට සැලකීමක් සිදු කෙරේ.

**365 වගන්තිය: අස්වාභාවික වරදක්**

දණ්ඩ නීති සංග්‍රහයේ මෙසේ සඳහන් වේ:

"ස්වභාව ධර්මයේ නියෝගයට එරෙහිව ඕනෑම පුරුෂයෙකු, ස්ත්‍රියක් හෝ සතෙකු සමඟ ස්වේච්ඡාවෙන් කායික සංසර්ගයේ යෙදුනහොත් ඔහුට සිර දඬුවම නියම කළ යුතුයි .."

දණ්ඩ නීති සංග්‍රහය මඟින් වයස අවුරුදු 16 ට (නීත්‍යානුකූල එකඟ වීමේ වයස) අඩු අයෙකු සමඟ ලිංගිකව හැසිරීම සඳහා ද ඉහළ දඬුවම් ලබා දේ.

**කැමැත්ත පළ කිරීමේ වයස යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?**

දරුවෙකුට ලිංගික ක්‍රියාකාරාම් සිදු කිරීම සඳහා කැමැත්ත දීමට හැකියාව ලැබෙන වයස මෙසේ හඳුන්වයි. දැනට ශ්‍රී ලංකාවේ මේ සඳහා වයස අවුරුදු 16 සම්පූර්ණ විය යුතුය. මෙහි තේරුම නම්, වයස 16 ට අඩු අයෙක් ලිංගික සම්බන්ධතාවයකට එකඟත්වය ලබාදීමට තරම් වයසට පැමිණ නොමැති බවයි. එම නිසා, වයස 16 ට අඩු දරුවෙකු ලිංගිකව එක්වීමට අවශ්‍ය යැයි පැවසූ විට ද, එසේ ලිංගිකව හැසිරීම දූෂණය කිරීමක් ලෙස සැලකේ. මෙයට හේතුව දරුවෙකුට ලිංගිකත්වයේ ස්වාභාවය හා එහි ප්‍රතිවිපාක තේරුම් ගැනීමට තරම් ප්‍රමාණවත් වයසකට පැමිණ නොතිබීමත්, ඔවුන්ට නීත්‍යානුකූලව එසේ කැමැත්ත පල කිරීමට නොහැකි වීමත් ය.

"ස්වාභාව ධර්මයේ අනුපිළිවෙලට විරුද්ධව කායික සංසර්ගය" යන්න න්‍යායාත්මකව ගුද සංසර්ගය වැනි ප්‍රජනනයට තුඩු නොදෙන ලිංගික ක්‍රියා ලෙස අර්ථ දැක්විය හැක. එහිදී විෂමරිසි පුද්ගලයින් අතර සිදුවන ලිංගික ක්‍රියාවන් ද මේ යටතට ඇතුළත් වේ. මෙම යෙදුම සමරිසි පුද්ගලයන් අතර සිදුවන ලිංගික ක්‍රියාවන් සඳහා පමණක් අදාල වන ආකාරයෙන් පුළුල් ලෙස තේරුම්ගෙන ඇත. 'කායික සංසර්ගය ව්‍යවස්ථාවේ දක්වා නැත. සංසර්ගය සාමාන්‍යයෙන් තේරුම් ගත හැක්කේ ඇතුළත් කිරීමක් හෝ ප්‍රවේශ වීමක් ලෙස ය.

### 365 (අ) වගන්තිය: පුද්ගලයන් අතර දැඩි අවිනීත ක්‍රියාවන්

**මෙම කොටසේ දී, දණ්ඩ නීති සංග්‍රහය පහත පරිදි විස්තර කරයි:**

"ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ වෙනත් පුරුෂයෙකු සමඟ තදබල අශෝභන ක්‍රියාවක් කරන හෝ එබඳු ක්‍රියාවකට පාර්ශවකරුවෙකු වන හෝ එබඳු ක්‍රියාවක් යම් පුරුෂයෙකු ලවා කරවන හෝ කරවීමට තැත් කරන පුරුෂයෙකු වරදකට වරදකාරී විය යුතු ය."

ලිංගික සංසර්ගය යටතට නොවැටෙන අනෙකුත් ලිංගික ක්‍රියාවල යෙදීම නිසා සමරිසි පුද්ගලයන් හට දඬුවම් කිරීම සඳහා මෙම කොටස භාවිතා කරනු ලබයි.

මෙම කොටස් දෙකම (එනම් 365 සහ 365(අ)) මගින් වැඩිහිටියන් අතර ලිංගික ක්‍රියාකාරකම් පෞද්ගලිකව සිදු වුවද එය අපරාධයක් ලෙස දැක්වේ.

**365 සහ 365 (අ) වගන්ති සෘජු පුද්ගලයින්ට අදාළ වේද?**
සිද්ධාන්තමය වශයෙන් මෙම නීති ලිංගික දිශානතිය නොසලකා සියලු මිනිසුන්ගේ, එකඟතාවයෙන් යුතුව සිදුකරන ලිංගික හැසිරීම් වලට අදාල වේ.

**මූලික අයිතිවාසිකම් පිළිබඳ නීතිය විවිධ ලිංගික දිශානතියන් ඇති පුද්ගලයින් ආරක්ෂා කරයිද?**
මූලික අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ සියලුම මිනිසුන්ට අදාළ වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ නීතිය ඉදිරියේ සියලු දෙනා සමාන වන අතර නීතියේ සමාන ආරක්ෂාව ලැබීමට අයිතියක් ඇති බවත් ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි හේතු වලින් එකක් මත කිසිදු පුරවැසියෙකු වෙනස් කොට සැලකීම සිදු නොකළ යුතු බවත්ය. එබැවින්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස, කතා කිරීමේ නිදහස, සාමකාමීව රැස්වීමේ නිදහස, සමාගමයේ නිදහස, නීත්‍යානුකූල රැකියාවක යෙදීමේ නිදහස සහ රට තුළ යාම් ඊම් නිදහස වැනි මූලික අයිතිවාසිකම් LGBT+ පුද්ගලයින්ට ද අදාළ වේ.
12 වෙනි ව්‍යවස්ථාව තුළ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, වෙනස් කොට සැලකීම සඳහා පදනමක් නොවන බව විශේෂයෙන් ම සඳහන් නොවන නමුත් එහි සඳහන් හෝ එවැනි "ඕනෑම හේතුවක්" යන වචනය තුලින් එය ගම්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රගතිශීලී පියවරක් වශයෙන්, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව වෙනස්කම්වලට ලක් නොවීමේ අයිතිය 2014 ජිනීවා හි පැවති මානව හිමිකම් කමිටුවේ 112 වන සැසිවාරයේදී ශ්‍රී ලංකා රජය විසින් පිළිගන්නා ලදී.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව අනුව කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාශාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය. මෙවැනි මිනුම් මඟින් පුද්ගලයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය පදනම් කරගෙන අපකීර්තියට පත් කිරීම හා වෙනස්කොට සැලකීම වලින් ආරක්ෂා කරයි."

**දේශකයා වෙත සටහනක්**
දණ්ඩ නීති සංග්‍රහය මඟින්, සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධකරණය කිරීම තුළින්, 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් විවිධ ලිංගික දිශානතිය ඇති පුද්ගලයින්ට වෙනස් කොට සලකන ආකාරය ගැන සටහනක් කරන්න. සහභාගිවන්නන් හට මෙම විරුද්ධාභාෂය අවබෝධ කරවා දී මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන මෙම නීති වෙනස් කිරීමට අපි ව්‍යවස්ථාදායකය සමඟ කටයුතු කළ යුත්තේ ඇයි දැයි යන්න තේරුම් කරවීමට වග බලා ගන්න.
ඉහත සඳහන් කළ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 **(අ)** වැනි වගන්ති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති සමානාත්මතාවය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කරන බව යමෙකුට තර්ක කළ හැකිය. ඇත්තෙන්ම මෙය නිවැරදි තර්කයකි.

කෙසේ වෙතත්, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ එම ව්‍යවස්ථාව 1978 දී බලාත්මක වන විට මෙරට පැවති නීති, එම නීති මඟින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වුවද තවදුරටත් එලෙසම ක්‍රියාත්මක වන බවයි. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තිය බලන්න). නීති සමාලෝචනය කිරීමේ බලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් විනිසුරුවරුන්ට ලබා නොදේ. එබැවින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හේතුවෙන් ව්‍යවස්ථා විරෝධීදැයි බැලීමට විනිසුරුවරුන්ට නොහැක. වෙනත් ආකාරයකින් කිවහොත්, නීතිය පිළිබඳ අධිකරණ සමාලෝචනයට ඉඩ ලබා නොදෙන නිසා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන නීති තවමත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. මෙම නීති සංශෝධනය කළ හැක්කේ පාර්ලිමේන්තුව හරහා පමණි. එබැවින් ජනතා නියෝජිතයන් හා මහජනතාව සමඟ වැඩ කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

**සමරිසි සහකරුවෙකු සිටින කෙනෙකුට සමීප සහකරු හිංසනයට එරෙහිව නීතිමය ආරක්ෂාවක් තිබේද?**
සමීප සහකාර ප්‍රචණ්ඩත්වයෙන් ගැලවුන අයෙකුට 2005 අංක 34 දරණ ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත යටතේ ආරක්ෂක නියෝගයක් ලබා ගත හැකිය (PDVA) මෙම පනත යටතේ, 'ගෘහස්ත හිංසනයක් සිදු වී ඇති, හෝ සිදු වීමට ඉඩ ඇති, යම් පුද්ගලයෙකුට ("අගතියට පත් පුද්ගලයෙක්") ගෘහස්ථ හිංසනයේ එවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ආරක්ෂක නියෝගයක් ලබාගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය.

සාක්ෂි මත පදනම්ව නඩුව විනිශ්චය කිරීමට පෙර පනත යටතේ අයදුම්පතක් ලැබීමෙන් පසු, දින 14 ක කාලයක් වලංගු වන පරිදි අතුරු ආරක්ෂක නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයට නිකුත් කළ හැකිය. මෙය ගෘහස්ථ හිංසනය වැළැක්වීම

සඳහා ඇති හදිසි අවශ්‍යතාවය සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අවශ්‍යතාවය යන අරමුණෙන් නිකුත් කරයි. සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව මාස 12 ක් වලංගු වන ආරක්ෂක නියෝගයක් නිකුත් කිරීමට ද අධිකරණයට හැකියාව ඇත. මෙම පනත මගින් සිවිල් පිළියමක් ලබා දීමෙන් අගතියට පත් තැනැත්තාගේ ආරක්ෂාව තහවුරු කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර ම, වෙනම අතිරේක සිවිල් හෝ අපරාධ නඩුවක් ආරම්භ කිරීමේ ඔවුන්ගේ අයිතිය ද ආරක්ෂා කෙරේ.

PDVA ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපක්ෂපාතී නිර්වචනයක් භාවිතා කරයි. එම නිසා, ඕනෑම පුද්ගලයෙකුට තම ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය නොසලකා තම 'සහකරු හෝ සහකාරිය', 'කාලත්‍රයා හෝ 'සහජීවන සහකරු' යන ඕනෑම අයෙකුගෙන් ආරක්ෂාව ඉල්ලා අයදුම්පතක් ගොනු කළ හැකිය. . මෙම පනත යටතේ ශාරීරික හිංසනය සහ චිත්තවේගී හිංසනය යන දෙකම ගෘහස්ත හිංසනය ලෙස සලකනු ලැබේ.

කෙසේ වෙතත්, පොලිසිය තුළ දී වෙනස් කොට සැලකීම් හෝ හිංසනයන්ට ලක් වේ යැයි ඇති බිය හේතුවෙන් සමරිසි සබඳතා ඇති පුද්ගලයින් ඉතා කලාතුරකින් PDVA වෙත යොමු වෙති.

***සමරිසි පුද්ගලයන්ට ශ්‍රී ලංකාවේදී විවාහ විය හැකිද?***
*ශ්‍රී ලංකාවේ නීතියට අනුව සමරිසි පුද්ගලයන්ට නීත්‍යානුකූලව විවාහ විය නොහැක.*

***සමරිසි පුද්ගලයන්ට එකට ජීවත් වීම නීති විරෝධීද?***
*365 සහ 365 (අ) සමරිසි සහකරුවන් අතර ලිංගික ක්‍රියා අපරාධමය වරදක් ලෙස සැලකුවද, සමරිසි පුද්ගලයන් (හෝ විෂමරිසි පුද්ගලයන්) එකට ජීවත් වීම වැළැක්වීමට නීතියක් නැත.*

***ශ්‍රී ලංකාවේ සමරිසි පුද්ගලයන්ට දරුවන් කුලවද්දා හදා ගත හැකිද?***
*ශ්‍රී ලංකාව තවමත් සමරිසි හවුල්කරුවන්ගේ එකතුව පවුලක් ලෙස හඳුනාගෙන නැති හෙයින් සමරිසි යුවළකට දරුවෙකු හදා ගැනීමට නොහැකිය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නීතිය මගින් පුද්ගලයෙකුට දරුවෙකු හදා වඩා ගැනීමට ඉඩ සලසයි. එම නිසා එක් සහකරුවෙකුට නීත්‍යානුකූලව දරුවෙකු දරුකමට හදා ගත හැකිය.*
*1941 අංක 24 දරන දරුකමට හදා ගැනීමේ ආඥාපනතට අනුව, තනි මාපියන් විසින් දරුවෙකු හදා වඩා ගැනීමට අවසර ඇත. නමුත්, පිරිමි අයදුම්කරුවෙකුට, ගැහැණු ළමයෙකු දරුකමට හදා ගැනීම නීතියෙන් අවසර ලබා නොදේ. විශේෂ හේතු තිබේ නම් පමණක් මෙයට අවසර දෙනු ඇත.*

***තම සමරිසි සහකරුගේ මරණයෙන් පසු දේපළ ජීවත්ව සිටින සහකරුවෙකුට ලබා දෙන්නේ කෙසේද?***
*ශ්‍රී ලංකාව තවමත් සමරිසි හවුල්කරුවන්ගේ එකමුතුවක් පවුලක් ලෙස හඳුනාගෙන නැති හෙයින්, අනුප්‍රාප්තිකය සම්බන්ධයෙන් නීතියේදී සමරිසි සහකරුවන් පිළිබඳ සැලකීමක් සිදුනොකරයි. එනම් අවසන් කැමැත්තකින් තොරව පුද්ගලයෙකු මිය ගිය පසු දේපල බෙදා දීමයි. එම නිසා, ජීවත්ව සිටින සහකරුට දේපල අයිතිය පැවරීම, දේපල හිමි තැනැත්තා විසින් මියයාමට පෙර සකස් කරන ලද අවසන් කැමැති පත්‍රයක් මගින් සිදු කළ යුතු වේ.*

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධ නීතිය සහ ඔබෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ කෙටි දේශනය සඳහා වූ සටහන් පහත දැක්වේ.

***සංක්‍රාන්ත සමාජභාවී පුද්ගලයන්ට නීත්‍යානුකූලව ස්ත්‍රී පුරුෂ භාවය වෙනස් කළ හැකිද?***
*ඔව්. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පිළිගැනීමේ සහතිකයක් ලබා ගැනීමේ ක්‍රියාවලියට සහය වන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය 2016 දී චක්‍ර ලේඛනයක් නිකුත් කළේය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිගැනීම සඳහා වූ සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය උප්පැන්න සහතිකයේ ස්ත්‍රී පුරුෂ භාවය සහ නම වෙනස් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වන අතර එය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 27 සහ 52 (1) වගන්ති වලට අනුකූල වේ. උප්පැන්න සහතිකය වෙනස් කිරීමෙන් පසු සංක්‍රාන්ත සමාජභාවී පුද්ගලයන්ට ජාතික හැඳුනුම්පත් වැනි අනන්‍යතාව තහවුරු කිරීමේ අනෙකුත් ලේඛනද නැවත අලුත් කර ලබා ගත හැකිය.*

***පොලිසියට ශ්‍රී ලංකාවේ දී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුව අත්අඩංගුවට ගත හැකිද?***
*නැත. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කළ හැකිය. කෙසේ වෙතත්, දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය බොහෝ විට සංක්‍රාන්ත සමාජභාවී පුද්ගලයන්ට ලිංගික හිරිහැර කිරීමට, බිය ගැන්වීමට සහ වැරදි ලෙස අත්අඩංගුවට ගැනීමට පවා භාවිතා කරයි (සහ සාම්ප්‍රදායික අර්ථයෙන් ස්ත්‍රී පුරුෂ භාවය සමග නොගැලපෙන ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශ කරන පුද්ගලයින් - උදාහරණයක් ලෙස පුරුෂ ස්වරූපයක් පෙන්නුම් කරන කාන්තාවන් හෝ සමරිසි පුද්ගලයින්*

**399 වගන්තියඃ අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම**
**දණ්ඩ නීති සංග්‍රහයේ මෙසේ සඳහන් වේඃ**
යමෙකු වෙනත් තැනැත්තෙකු ලෙස බොරුවට හඟවමින් හෝ වෙනත් තැනැත්තෙකු වෙනුවට තවත් තැනැත්තෙකු දැනුවත් ව පෙනී සිටිමින් හෝ එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නියම වශයෙන්ම එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තෙකු නොව, අන් තැනැත්තෙක් යයි නිරූපණය කරමින් රවටතොත්, ඔහු "අනෙකෙකු ලෙස පෙනී සිටිමින් වංචා කළ ලෙස" සලකනු ලැබේ. පෙනී සිටිනු ලැබූ තැනැත්තා සත්‍ය තැනැත්තෙකු වුව ද, සිතින් මවා ගත් තැනැත්තෙකු වුව ද, වරද සිදු කෙරේ.

මෙම කොටස මඟින්,

■ එකම නම ම ඇති එක්තරා ධනවත් වෙළෙන්දෙකු බව හඟවමින් "A" වංචා කරයි.

මෙහි දී "A" අනෙකෙකු ලෙස පෙනී සිටීමෙන් වංචා කරයි.

■ නැසීගිය තැනැත්තෙකු වන "B" යයි හඟවමින් "B" වංචා කරයි.

මෙහිදී "B" අනෙකෙකු ලෙස පෙනී සිටිමින් වංචා කරයි.

(මෙම කොටස පොලිසිය විසින් භාවිතා කරනුයේ පුද්ගලයෙකුගේ ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශ කිරීම 'මහජනයා නොමඟ යවන' පදනම මත පමණි. )

**සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට විවාහ විය හැකිද?**
තම සැබෑ සමාජභාවය දැක්වෙන හැඳුනුම්පත් ලබා ගත් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුට විරුද්ධ සමාජභාවී අයෙකු හා විවාහ විය හැකිය. නිදසුනක් වශයෙන්, උපතේදී පුරුෂයෙකු වශයෙන් හඳුන්වා දුන් නමුත් දැන් කාන්තාවක් ලෙස හැඳුනුම්පත් ලබාගෙන ඇති සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට නීත්‍යානුකූලව පුරුෂයෙකු සමඟ විවාහ විය හැකිය.

**සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට සමීප සහකාර ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමට නීතියක් තිබේද?**
ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත යටතේ සංක්‍රාන්ත සමාජභාවී පුද්ගලයන්ට සමීප සහකරුගේ හිංසනයෙන් ආරක්ෂාව ලබා ගත හැකිය.
PDVA ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අපක්ෂපාතී පාරිභාෂිතයක් භාවිතා කරයි. එම නිසා ඕනෑම පුද්ගලයෙකුට තම ස්ත්‍රී **පුරුෂ** භාවය, සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය නොසලකා තමාගේ කලත්‍රයා, හිටපු කලත්‍රයා හෝ සහජීවන සහකරු යන ඕනෑම පුද්ගලයෙකුගෙන් ආරක්ෂාව ඉල්ලා අයදුම්පතක් ගොනු කළ හැකිය. මෙම පනත යටතේ ශාරීරික හිංසනය සහ චිත්තවේගී හිංසනය යන දෙකම ගෘහස්ත හිංසනය ලෙස සැලකේ.

කෙසේ වෙතත්, වැඩි හිංසනයකට ඇති බිය හේතුවෙන් බොහෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් මෙම පනත තුළින් සහන සොයන්නේ නැත.
Women in need, (0112 671 411/https://www.winsl.net) PDVA භාවිතා කර ආරක්ෂාව අපේක්ෂා කරන කාන්තාවන් සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් සඳහා නොමිලේ නීති සහාය ලබා දේ.

**ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රයන් මාරු කිරීමේ ශල්‍යකර්මයකට භාජනය වීම අත්‍යවශ්‍යද?**
නැත. 2016 චක්‍ර ලේඛනයට අනුව, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට 'වෙනස් සමාජභාවයක් සහිත පුද්ගලයෙකු' ලෙස ජීවත් වීමට හා පිළිගැනීමට ආශාවක් තිබිය යුතු අතර, ඔවුන්ගේ ශරීරය හැකිතාක් සිය නව සමාජභාවයට ගැලපෙන ආකාරයට පත් කර ගැනීම සඳහා අදාළ වන ශල්‍යකර්මයක් හා හෝමෝන ප්‍රතිකාරයක් ලබා ගැනීමට ආශාවක් තිබිය යුතුය.
කෙසේ නමුත්, මෙම ස්ත්‍රී පුරුෂ පරිවර්තන ක්‍රියාවලිය යටතට ගැනෙන යම් යම් සත්කාර, 'සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට සෞඛ්‍ය සඳහා වූ වෘත්තීය වෘත්තිකයින්ගේ සංගමය' (WPATH) විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තරව හඳුනාගත් හා පිළිගත් ප්‍රමිති අනුව සිදු කිරීම අවශ්‍ය වේ.
හෝර්මෝන ප්‍රතිකාර ගැනීම ද මෙයට ඇතුළත් වේ. එම පුද්ගලයා විසින් සමාජය විසින් සම්මත කරගෙන ඇති සමාජභාවී භූමිකාව වෙත පරිවර්තනය වීම, නැතහොත් සමාජභාවී ප්‍රකාශනය සමඟ සමපාත වීම ද සම්පූර්ණ කළ යුතුව ඇත.

දේශකයා වෙත සටහනක්

මෙම සටහන් ලියන මොහොත වනවිට එනම් 2021 අගෝස්තු මාසය වන විට, ස්ත්‍රී පුරුෂ භාවය පිළිගැනීමේ සහතිකය ලබා ගැනීමේදී ප්‍රායෝගික අභියෝග ගණනාවක් තිබේ. 2016 චක්‍ර ලේඛනයෙන් මනෝචිකිත්සකවරයෙකු හමුවිය යුතු වාර ගාණන සඳහන් කර නොමැති අතර හෝ මනෝ වෛද්‍යවරයාට පැහැදිලි උපදෙස් ලබා දී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සහතිකය නිකුත් කිරීම මුළුමනින්ම මනෝ වෛද්‍යවරයාගේ අභිමතය පරිදි සිදු වේ. ඒ අතරම, මෙම සේවාව ලබා ගත හැකි රෝහල් සීමිතය. දැනට මෙම සේවාව ලබා දෙන්නේ රජයේ ආයතන 5 ක් පමණක් වන අතර, ආයතන 4 ක් සඳහන් කරන පරිදි මෙම සේවාව අදාළ දිස්ත්‍රික්කයේ පුද්ගලයින් සඳහා පමණක් ලබා දෙයි. අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය ආයතනය පමණක් රට පුරා සිටින පුද්ගලයින් සඳහා සේවාව ලබා දේ. කෙසේ වෙතත්, මෙම රෝහලේ වෛද්‍යවරුන් නොමැතිකම අභියෝගයක්ව පවතී.

පහත දැක්වෙන්නේ ලිංගික හිංසනය සම්බන්ධ නීතිය පිළිබඳ කෙටි දේශනය සහ ඔබෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ සටහන් ය.
ලිංගිකත්වය සහ ලිංගික හිංසනයේ ප්‍රධානත ම වෙනස කැමැත්ත පල කිරීම සහ කැමැත්ත පල නොකිරීම යන බව පෙන්වා දීමෙන් මෙය ආරම්භ කරන්න.
කැමැත්ත පැහැදිලි කිරීම සඳහා ඔබට මෙම වීඩියෝව පෙන්වීම කළ හැකිය (ඇත්තේ ඉංග්‍රීසියෙන් පමණි) (https://www.youtube.com/watch?v=oQbei5JGiT8)

***ශ්‍රී ලංකාවේ නීතිය යටතේ පිරිමි පුද්ගලයෙක් දූෂණය කිරීමකට දඬුවම් කළ හැකිද?***
*පුරුෂයෙකු හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් දූෂණය කිරීම, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි නමුත්, 'ස්ත්‍රී දූෂණය' යන වරද යටතට එය නොවැටේ.*

**363 වගන්තියඃ දූෂණය**
මෙම කොටසේ මෙසේ සඳහන් වේඃ
පහත සඳහන් ඕනෑම විස්තරයකට අදාළ වන වාතාවරණයක් යටතේ කාන්තාවක් සමඟ ලිංගික සංසර්ගයේ යෙදෙන පිරිමියෙක් "දූෂණය" කරන බව කියවේ ...
මෙම වගන්තිය යටතේ කොන්දේසි 5 ක් ලැයිස්තුගත කර ඇත. අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා මෙම අවස්ථා 5 පහත පරිදි වෙන්කර ඇත.

- කාන්තාවකගේ අනුමැතියක් නොමැතිව.
- කාන්තාව පුරුෂයාගේ බිරිඳ නම්, බිරිඳ අධිකරණමය වශයෙන් වෙන් වුවහොත් ඇයගේ අනුමැතියකින් තොරව ලිංගික සංසර්ගය.
- ඇය නීත්‍යානුකූල හෝ නීති විරෝධී ලෙස රඳවා තබා ගැනීමේදී ඇයගේ කැමැත්ත ඇතිව.
- බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ රඳවා ගැනීමේ තර්ජනයෙන් හෝ මරණයට හෝ රිදවීමට බිය වීමෙන් ඇයගේ කැමැත්ත ලබා ගත් විට ඇයගේ කැමැත්ත ඇතිව.
- ඇය නොසන්සුන් මනසකින් සිටි අවස්ථාවක ඇයගේ කැමැත්ත ලබාගෙන ඇති විට ඇයගේ කැමැත්ත ඇතිව.
- මත් පැන් හෝ මත් ද්‍රව්‍ය නිසා ඇති වූ මත්වීමක සිටින විට ඇයගේ කැමැත්ත ඇතිව, පුරුෂයා හෝ වෙනත් අයෙකු විසින් ඇය පරිපාලනය
- ඔහු තම ස්වාමිපුරුෂයා නොවන බවත්, ඔහු ඇයගේ නීත්‍යානුකූල විවාහක ස්වාමිපුරුෂයා බව විශ්වාස කරන නිසා ඇයගේ කැමැත්ත ලබා දෙන බවත් මිනිසා දැනගත් විට ඇයගේ එකඟතාවයෙන්.
- ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ඇයගේ වයස අවුරුදු 16 ට අඩු නම් (කාන්තාව ඔහුගේ බිරිඳ නොවන්නේ නම්, උදාහරණයක් වශයෙන් මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ, වයස අවුරුදු දොළහට වැඩි).

ලිංගික සංසර්ගය හෙවත් මෛථුනය සංයුක්ත කිරීම සඳහා ප්‍රවේශනය පමණක් ප්‍රමාණවත් බව එම කොටස පැහැදිලි කරයි. කැමැත්තෙන් තොරව ලිංගික සංසර්ගය සිදු වූ බව සනාථ කිරීම සඳහා ශරීරයට සිදු වී ඇති ශාරීරික තුවාල වැනි ප්‍රතිරෝධය පෑම පිළිබඳ සාක්ෂි අත්‍යවශ්‍ය නොවන බව තවදුරටත් පැහැදිලි කෙරේ.

**මෙම කොටස අදාළ වන්නේ පුරුෂයෙකු විසින් යෝනි මාර්ගයට ප්‍රවේශනය වීම මඟින් කාන්තාවක් දූෂණය කරන අවස්ථාවකට පමණි.**

**365 B වගන්තියඃ බරපතල ලිංගික අපයෝජන**

365 B වගන්තියේ මෙසේ සඳහන් වේ:
ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කරමින් සිදු කරන, 363 වන වගන්තියේ සඳහන් ස්ත්‍රී දූෂණය යටතට ද නොවැටෙන, පහත දැක්වෙන විස්තර අතුරෙන් යම් විස්තරයකට යටත් වන, යම් ක්‍රියාවක් "බරපතල ලිංගික අපයෝජනයක්" ලෙස සැලකේ. අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා මෙම අවස්ථාවන් පහත පරිදි බෙදා ඇත.

1. පුද්ගලයාගේ අනුමැතියකින් තොරව.
2. අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව අනෙක් එම තැනැත්තා වයස අවුරුදු 16 ට අඩු වූ විට.
3. අනෙක් තැනැත්තාගේ අනුමැතිය ඇතිව වුවද, නීත්‍යානුකූල හෝ නීති විරෝධී ලෙස රඳවා තබාගෙන සිටිය දී.
4. බලහත්කාරය භාවිතා කරමින්, තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ ඒ අනෙක් තැනැත්තාට මරණ බය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් අනෙක් තැනැත්තාගෙන් කැමැත්ත ලබා ගෙන ඇති අවස්ථාවක,
5. අනෙක් තැනැත්තා සිහිවිකලව සිටිය දී කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක,
6. මත්පැන් හෝ මත්ද්‍රව්‍ය මඟින් ඇති කරන ලද මත් වූ තත්වයක සිටියදී අනෙක් තැනැත්තාගේ අනුමැතිය ඇතිව.

මෙම කොටසේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උදාසීන පාරිභාෂික වාක්‍යය භාවිතා කෙරේ. ස්ත්‍රී පුරුෂ භාවයක් නොසලකා ඕනෑම පුද්ගලයෙක්ට මෙම අපරාධය වෙනත් පුද්ගලයෙක්ට එරෙහිව සිදු කළ හැකිය.
කාන්තාවක්ව ගුද දූෂණය, බලහත්කාරයෙන් සිදු කරන මුඛ සංසර්ගය, බලහත්කාරයෙන් සිදු කරන කලවා අතර සංසර්ගය හෝ කිසියම් වස්තුවක් හෝ ශරීරයේ කොටසක් බලහත්කාරයෙන් ඇතුල් කිරීමක් වැනි ඕනෑම ආකාරයේ ලිංගික අඩත්තේට්ටම්වලට් ලක් කර ඇත්නම්, එවැනි ක්‍රියාවක් 365B වගන්තිය යටතේ එන"බරපතල ලිංගික අපයෝජන" සිදුකිරීම යන ගණයට වැටේ.
පුරුෂයෙකු හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් දූෂණය කළ විට ද අදාළ වන්නේ එම වගන්තියම වේ. ගුද දූෂණය, බලහත්කාරයෙන් සිදු කරන මුඛ සංසර්ගය, කලවා අතර සිදු කරන සංසර්ගය හෝ කැමැත්තකින් තොරව වස්තුවක් හෝ ශරීරයේ කොටසක් වෙනත් පුද්ගලයෙකුගේ සිරුරට ඇතුළු කිරීම වැනි ලිංගික හිංසනය මෙයට ඇතුළත් ය.

***363 සහ 365 B අතර වෙනස්කම් හඳුනා ගැනීමට සහභාගිවන්නන්ට ආරාධනා කරන්න.***

ස්ත්‍රී දූෂණ වරදට 364 වගන්තිය යටතේ යම් යම් වරදෙහි ස්වාභාවය තීව්‍ර වන තත්වයන් යටතේ ඉහළ දඬුවම් ලැබිය යුතු බව සලකන්න - එම වරද වඩාත් බරපතල ලෙස සැලකෙන අවස්ථා එමටය. නිදසුනක් වශයෙන්, තම භාරයේ සිටින කාන්තාවකට එරෙහිව රාජ්‍ය නිලධාරියෙකු විසින් සිදු කළ ස්ත්‍රී දූෂණය, රෝහල් කාර්‍යමණ්ඩල සාමාජිකයෙකු හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් රෝහලේ සිටින කාන්තාවක්ව දූෂණය කිරීම, ගැබිණි කාන්තාවක් දූෂණය කිරීම, වයස අවුරුදු 18ට අඩු ළමයෙක්, මානසික හෝ කායික ආබාධවලින් පෙලෙන කාන්තාවක් දූෂණය කිරීම සහ සමූහ දූෂණය යනාදිය වඩාත් බරපතළ අපරාධ ගණයේ ලා සැලකේ. එසේ 365B වගන්තීය යටතේ ඇති වරදවල්වල "ස්වාභාවය තීව්‍ර වන අවස්ථාවන්" වෙනත් වගන්තියක සඳහන් කර නැත.

***පොදු ප්‍රවාහන සේවා වලදී පුද්ගලයෙකුගේ ලිංගික අවයව පෙන්වීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට චෝදනා කළ හැකිද?***
මෙය දණ්ඩ නීති සංග්‍රහයේ.345 යටතේ ලිංගික හිංසනයකට සමාන වේ.

**345 වගන්තිය: ලිංගික අතවර කිරීම**

*"අඩත්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තෙකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තෙකු..."*

මෙම කොටසේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ උදාසීන පාරිභාෂික වාක්‍යය භාවිතා කෙරේ. තම ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නොසැලකා හැර ඕනෑම පුද්ගලයෙක්ට තවත් ඕනෑම පුද්ගලයෙක්ට එරෙහිව ලිංගික අතවර කිරීම යන මෙම වගන්තිය යටතේ චෝදනා ගොනු කළ හැකිය.

*පැහැදිලි කිරීම*

- *"වැඩ කරන ස්ථානයක බලය දරන තැනැත්තෙකු විසින් වැඩ අරන ස්ථානයක දී හෝ වෙනත් යම් ස්ථානයක දී වචනයෙන් හෝ ක්‍රියාවෙන් කරනු ලබන අනනුඥාත ලිංගික ප්‍රයත්න, ලිංගික අතවර කිරීමේ වරද යටතට ගැනේ.*
- *මෙම කොටසේ අරමුණු සඳහා 363 වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණ හෝ 365 B වගන්තිය යටතේ බරපතල ලිංගික අපයෝජන සිදු නොවන ඕනෑම අඩත්තේට්ටම් කිරීමක් ඇතුළත් විය හැකිය.*

යම් ක්‍රියාවක් ස්ත්‍රී දූෂණයට හෝ බරපතල ලිංගික අපයෝජනයට ප්‍රමාණවත් නොවේ නම්, එවැනි ක්‍රියාවක් මෙම වගන්තිය යටතේ පැවරේ. මෙම වගන්තිය යටතේ නඩු පැවරිය හැකි ක්‍රියාවන් පිළිබඳ සහභාගිවන්නන්ගෙන් ඔබට ඇසිය හැකිය.
ලිංගික සම්බන්ධතා ඇතුළත් නොවන ක්‍රියාවන්, නිදසුනක් ලෙස ලිංගිකත්වයට පිළිඹිබු කරන අදහස් පළ කිරීම හෝ එවැනි ඉරියව්වක් ප්‍රදර්ශනය කිරීම, අනෙකාගේ කැමැත්තකින් තොරව ලිංගිකත්වය පෙන්නුම් කරන පින්තූර පෙන්වීම, වෙනත් අයෙකුගේ කලිසම ඇගෙන් ඉවත් කිරීම හෝ ඇඳුම් උනා දැමීම, වෙනත් අයෙකු ඇඳුම් උනා දමන ආකාරය නැරඹීම හෝ කැමැත්තකින් තොරව වෙනත් අයෙකු සමග වෙනත් ලිංගික ක්‍රියා සිදු කිරීම වැනි ක්‍රියාවන්ට එරෙහිව 345 වගන්තිය යටතේ ක්‍රියාමාර්ග ගත හැකිය.
තව ද, දෙවන පැහැදිලි කිරීම අනුව, ඕනෑම ආකාරයේ ලිංගික අතවරයක්, නිදසුන් ලෙස අනෙකාගේ කැමැත්තකින් තොරව ලිංගික අවයව හෝ ශරීරයේ වෙනත් කොටසක් ස්පර්ශ කිරීම, බලහත්කාරයෙන් සිප ගැනීම යනාදි ක්‍රියාවන් ද මෙම වගන්තිය යටතට ගැනෙන බව ද සඳහන් කරන්න.

**මෙම කොටස 365B හා සැසඳීම ප්‍රයෝජනවත් වේ.**

| 365 B වගන්තිය : බරපතල ලිංගික අපයෝජන | 345 වගන්තිය : ලිංගික හිංසනය |
|---|---|
| "බරපතල ලිංගික අපයෝජනයක් සිදු කිරීම යනු, ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන්, පහත දැක්වෙන විස්තර අතුරෙන් යම් විස්තරයකට අයත් වන ඕනෑම අවස්ථාවක....." | "අඩත්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තෙකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තෙකු ලිංගික අතවර කිරීමේ වරද සිදු කරයි" |

***රැකියා ස්ථානයේ ලිංගික හිංසනයන් සිදු කිරීම ශ්‍රී ලංකාව තුළ අපරාධයක් ලෙස සැලකේ ද?***
රැකියා ස්ථානයේ සිදුවන ලිංගික හිංසනය 345 වගන්තිය පැහැදිලි කිරීමේ දී පැහැදිලිව දක්වා ඇත.

***කැමැත්තෙන් තොරව නිරුවත් ඡායාරූප හුවමාරු කර ගැනීම අපරාධයක්ද?***
කැමැත්තෙන් තොරව වැඩිහිටියෙකුගේ නිරුවත් ඡායාරූප හුවමාරු කර ගැනීම 345 වගන්තියට අනුව අපරාධයකි. අසභ්‍ය ප්‍රකාශන සඳහා අදාළ වන නීති ඇති අතර ඒවා අදාළ අවස්ථාවලදී ද භාවිතා කළ හැකිය.
වයස අවුරුදු 18 ට අඩු කෙනෙකුගේ නිරුවත් ඡායාරූප හුවමාරු කර ගැනීම "ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශන" යටතේ 286 යන වගන්තියට අනුව අපරාධයක් වන අතර ළමයින් සම්බන්ධ ප්‍රදර්ශනයේදී අවුරුදු 2-10 දඬුවම් නියම වේ.

***කාන්තාවකට ලිංගික අතවර කළ කාන්තාවකට ලංකාවේ නීතිය යටතේ දඬුවම් කළ හැකිද?***
කාන්තාවකට ලිංගිකව අතවර කරන කාන්තාවකට එරෙහිව, එම ලිංගික අතවරය තුළ ඇති ලිංගික හිංසනයේ ප්‍රමාණය අනුව 345 හෝ 365 B වගන්ති යටතේ නඩු පැවරිය හැකිය.

# සැසිය 03 ලිංගිකත්වය/ලිංගික ක්‍රියාවන් හා ලිංගික හිංසනය සම්බන්ද නීතීන් පිළිබඳ ක්‍රියාකාරකම්

*සහභාගීවන්නන් කණ්ඩායම් වශයෙන් එක්ව දී ඇති සිදුවීම් වලට අදාළ වන නීති මොනවාදැ යි හඳුනා ගැනීමට උත්සාහ කරයි. කණ්ඩායම් දෙකක් දී ඇති අවස්ථා 12ට අදාළ වන නීති මොනවාදයි හඳුනා ගැනීමට උත්සාහ කරයි. එක් කණ්ඩායමකට සිදුවීම් 6 බැගින් ලබා දේ. එම අපරාධ සඳහා නියම කළ යුතු යැයි ඔවුන් සිතන දඬුවම් ද හඳුනා ගනී. පළමු කණ්ඩායමට පළමු සිදුවීම් 6 පැහැදිලි කිරීමටත්, දෙවන කණ්ඩායමට ඉතිරි සිදුවීම් 6 පැහැදිලි කිරීමටත් ආරාධනා කරන්න. සහභාගීවන්නන් සැසිය මෙහෙයවන්නා සමග එකතුව මේ පිළිබඳ සාකච්ඡා කරයි. සැසිය මෙහෙයවන්නා මෙහිදී නීතිය මඟින් නිශ්චය කර ඇති දඬුවම් පිළිබඳව ද පැහැදිලි කරයි.*

### කාලය
පැය 1

### ඉලක්ක ගත කණ්ඩායම්
සැසියකට සහභාගිවන්නන් 30ක් පමණ

### අරමුණු
මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන් හට :

- විශේෂිත අවස්ථා වලදී අදාළ වන නිශ්චිත නීති හඳුනා ගැනීමට හැකි වේ.

### අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය

- ඉතා මැනවින් මුද්‍රිත කාඩ්පත්, නැවත ස්ථානගත කළ හැකි Adhesive spray සහ පුවරු
- මුද්‍රණය කළ යුතු කාඩ්පත් ඇමුණුම් වල දක්නට ඇත.
- ලබා ගත නොහැකි නම් 2X (විශාල ප්‍රමාණයේ) අතින් ලියන ලද සටහන් සහිත ඇලෙන සුළු සටහන් භාවිතා කළ හැකිය.

### සකස් කිරීම
මුද්‍රිත කාඩ්පත්

### පියවර

- සෑම කණ්ඩායමකම සහභාගීවන්නන් 5-8 දක්වා වන පරිදි සහභාගිවන්නන් කණ්ඩායම් 4 කට බෙදන්න.
- මෙම ක්‍රියාකාරකම තුළදී, යම් අවස්ථාවක දී අදාළ වන නීතිය හඳුනා ගැනීමට අපි උත්සාහ කරන බව පැහැදිලි කරන්න.
- කණ්ඩායම් හතර අතරට කාඩ් කුට්ටම් හතර බැගින් බෙදා හැර මේසයේ ඇති කාඩ්පත් ගලපන්නැයි කියන්න.
- පිළිවෙල තහවුරු වූ පසු ඇලෙන සුළු සටහන් හෝ කාඩ්පත් ( Adhesive spray භාවිතයෙන්) පහත දැක්වෙන අනුපිළිවෙල අනුව පුවරුවක හෝ පිටු පෙරලිය හැකි රූප සටහනක අලවන ලෙස උපදෙස් දෙන්න.
- මෙම කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහභාගිවන්නන්ට විනාඩි 20 ක් ලබා දෙන්න.
- කණ්ඩායම් වලට ඇති විය හැකි ප්‍රශ්න වලට පිළිතුරු දීමෙන් ඔවුන්ට උදව් කරන්න.
- ක්‍රියාකාරකම් අවසන් වූ පසු එය ඉදිරිපත් කිරීම සිදුකිරීමට සෑම කණ්ඩායමකටම පවසන්න..
- අනෙක් කණ්ඩායමේ සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට හෝ අදහස් දැක්වීමට ඉඩ දෙන්න.
- සාකච්ඡාව අවසානයේදී, පහත දැක්වෙන අනුපිළිවෙලෙට දැනට පවතින නීතිය යටතේ දඬුවම් දැක්වෙන කාඩ්පත් අලවන්න. පවතින නීතිය හා සහභාගීවන්නන් අපේක්ෂා කරන නීති අතර ප්‍රධාන වෙනස්කම් සඳහන් කරන්න.

- සම්පත් දායකයා වෙත සටහන:
  කැමැත්තෙන්, එකඟත්වයෙන් සිදුවන ලිංගික ක්‍රියා සඳහා ද ඕනෑම දඬුවම් දීමට එකඟ බව සහභාගීවන්නන් පැවසීමේ දී, ඒ පිළිබඳව පරික්ෂාකාරී වන්න. වටිනාකමකින් යුත් පැහැදිලි කිරීමක් සහ ආකල්ප පිලිබඳ සැලකිල්ලෙන් ආමන්ත්‍රණය කිරීමක් මෙහිදී අවශ්‍ය විය හැක..

**කාඩ් සෙට් 01**

සිද්ධිය | අදාළ නීතියෙහි කොටස | සහභාගිවන්නන් ලබා දීමට කැමති දඬුවම | පවතින නීතිය යටතේ දඬුවම්

| සිද්ධිය | නීතිය | වගඋත්තරකරුවන් විසින් තීරණය කරන ලද දඬුවම | පවතින නීතිය යටතේ දඬුවම |
|---|---|---|---|
| අමාලි සහ සරණි පෙම්වතුන් ය. ඔවුන් දෙදෙනාම 19 හැවිරිදි කාන්තාවන් වේ. සාදයකදී ඔවුන් සරාගී ලෙස සිප ගනිමින් සිටියදී පොලිසිය පැමිණ ඔවුන් දෙදෙනාම අත්අඩංගුවට ගෙන ඔවුන්ට විරුද්ධව චෝදනා ගොනු කරන බවට තර්ජනය කරයි. | පුද්ගලයින් අතර දැඩි අශෝභන ක්‍රියාවන් යනු " ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තෙකු සමඟ යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශවකරුවෙකු වන හෝ එබඳු ක්‍රියාවක් යම් තැනැත්තෙකු විසින් කරනු ලැබීමට පොළඹවන හෝ පෙළඹවීමට තැත් කිරීමයි. මෙම වරද කරන ඕනෑම තැනැත්තෙකු වරදකට වරදකරු වනු ඇත " | නැත | අවුරුදු 0-2 ක සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙකම.<br><br>එක් අයෙක් අවුරුදු 16ට අඩු නම්, දඩ සහ වන්දි සමඟ අවුරුදු 10-20 සිර දඬුවමක් |
| ස්ටීවන් සහ අමල් පෙම්වතුන් ය. ඔවුන් දෙදෙනාම වයස අවුරුදු 20 පසුවන පිරිමින් ය. පෙම් හමුවක්/දිනයක් අවසානයේ නිවසට එන අතරමගදී ඔවුන් කතා කිරීමට මෝටර් රථය පාලු පාරක නවතයි. පසුව ඔවුන් මෝටර් රථය තුලදී ලිංගික සංසර්ගයේ යෙදී සිටිති. ඔවුන් පසු කරමින් යන පොලිස් නිලධාරීන් ඔවුන් දෙදෙනාව අත්අඩංගුවට ගත්හ. | 365 වගන්තිය: 'අස්වාභාවික වරදක්' "ස්වභාව ධර්මයේ නියෝගයට එරෙහිව ඕනෑම පුරුෂයෙකු, ස්ත්‍රියක් හෝ සතෙකු සමඟ ස්ව කැමැත්තෙන් කායික සංසර්ගයේ යෙදුනහොත් ඔහුට සිර දඬුවම් නියම කළ යුතුයි ..." | නැත | දඩ සමඟ වසර 0-10 ක සිර දඬුවමක්..<br>එක් අයෙකුට 16ට අඩු නම්, දඩ සහ වන්දි සමඟ වසර 10-20 සිර දඬුවමක්. |
| තිමාල් 25 හැවිරිදි පුද්ගලයෙකි. ඔහු වයස අවුරුදු 19 ක් වන ජේක් සමඟ සම්බන්ධතාවයක් පවත්වයි<br>තිමාල් සහ ජේක් නිරුවත් පින්තූර හුවමාරු කර ගනී.<br>තිමාල් ජේක් ගෙන් වෙන් වෙයි.<br>ජේක්ට දුකට සහ කේන්තියට පත් වෙයි.<br>පසුව ජේක් තිමාල්ගේ නිරුවත් පින්තූර වෙබ් පිටුවකට උඩුගත (upload) කර තිමාල්ගේ ෆෙස්බුක් පිටුවේ එම සැබැඳීන් (link) බෙදාහරී. | 345 වගන්තිය: ලිංගික හිංසනය " කවුරුන් හෝ අඩන්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන්, වෙනත් පුද්ගලයෙකුට ලිංගික අතවර කිරීම, හෝ වචන හෝ ක්‍රියාවන් භාවිතා කිරීමෙන්, වෙනත් පුද්ගලයෙකුට ලිංගික අතවරයක් හෝ හිරිහැර කිරීමක් සිදු කරන්නේ නම්, ලිංගික අතවර කිරීමේ වරද සිදු කරයි ..." | නැත | අවුරුදු 0-5 ක සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙකම.<br>වින්දිතයාට උසාවියෙන් වන්දි ලබා දිය හැකිය. |

කාඩ් සෙට් 02

| සිද්ධිය | නීතිය | වගඋත්තරකරුවන් විසින් තීරණය කරන ලද දඬුවම | පවතින නීතිය යටතේ දඬුවම |
|---|---|---|---|
| සූ යනු සමරිසි කාන්තාවකි.<br>ඇයට වයස අවුරුදු 19 ක් වන අතර පෙම්වතියක් සිටී.<br>ඇගේ වැඩිමහල් සොහොයුරා මේ ගැන දැඩි කෝපයෙන් සිටී.<br>ඔහු මැරවරයෙක් වන ඔහුගේ හොඳම මිතුරා වන හරීන්ගෙන් සූට 'පාඩමක් උගන්වන ලෙස' ඉල්ලා සිටී.<br>හරීන් කොසු පොල්ලක් භාවිතයෙන් ඇයව දූෂණය කරයි. | 365 බී වගන්තියඃ බරපතල ලිංගික අපයෝජනය<br>'බරපතල ලිංගික අපයෝජනය යනු' පුද්ගලයාගේ අනුමැතියකින් තොරව<br>ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක්, වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන් කිසියම් ක්‍රියාවක් සිදු කිරීමයි" | (blank card) | දඩ සහ වන්දි සමඟ වසර 7-20 සිර දඬුවම් |
| ෂෙහාන් 15 හැවිරිදි පිරිමි ළමයෙකි.<br>ඔහු තම වැඩිමහල් සොහොයුරාගේ හොඳම මිතුරා වන මලික් නැමැති කඩවසම් 22 හැවිරිදි තරුණයෙකු සමඟ ආදරයෙන් බැඳී සිටී.<br>ඔවුන් ක්‍රමයෙන් මිතුරන් බවට පත් වන අතර දිනක් නිවසේ වෙනත් කිසිවෙකු නොමැති විට ෂෙහාන් මලික්ට ආරාධනා කරයි.<br>ඔවුන් ලිංගිකව හැසිරෙයි.<br>හදිසියේම ෂෙහාන්ගේ දෙමාපියන් නිවසට පැමිණෙන අතර ඔවුන් දැඩි කෝපයට පත් වේ.<br>ඔවුන් පොලිසියට පැමිණිලි කරති.<br>පොලිසිය මලික් අත්අඩංගුවට ගනී. | 365 බී වගන්තියඃ බරපතල ලිංගික අපයෝජනය<br>'බරපතල ලිංගික අපයෝජනය යනු' පුද්ගලයාගේ අනුමැතියකින් තොරව<br>ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක්, වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන් කිසියම් ක්‍රියාවක් සිදු කිරීමයි"<br><br>අනෙකාගේ අනුමැතිය ඇතිව හෝ නැතිව අනෙකාගේ වයස අවුරුදු 16 ට අඩු වූ විට | | දඩ සහ වන්දි සමඟ වසර 10-20 සිර දඬුවම් |
| ශානි සංක්‍රාන්ති සමජභාවී , ලිංගික වෘත්තික කාන්තාවකි.<br>දිනක් ශානි සාප්පුවට යන විට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඇයව අත්අඩංගුවට ගෙන පොලිසියට ගෙන යයි.<br>ඇය මීට පෙර දෙතුන් වතාවක් පොලිස් අත් අඩංගුවට පත්ව ඇති බැවින් ඇය ලිංගික ශ්‍රමික කාන්තාවක් බව පොලිසිය දනී.<br>ඔවුන් ඇයව සිර මැදිරියක දමා සිවිල් ඇඳුමින් සැරසී පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සමඟ මුඛ සංසර්ගය කළහොත් ඇයට යන්න දෙන බව පැවසීය. | 365 බී වගන්තියඃ බරපතල ලිංගික අපයෝජනය<br>'බරපතල ලිංගික අපයෝජනය යනු' පුද්ගලයාගේ අනුමැතියකින් තොරව<br>ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක්, වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන් කිසියම් ක්‍රියාවක් සිදු කිරීමයි"<br>363 වගන්තිය යටතේ පහත සඳහන් | | දඩ සහ වන්දි සමඟ වසර 7-20 සිර දඬුවම්<br>සටහනඃ මෙය වධහිංසාවෙන් නිදහස් වීමේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීමකි. |

| | | | |
|---|---|---|---|
| ඇය ඊට එකඟ විය.<br>පසුව පොලිස් නිලධාරීන් ඇයට රුපියල් 5000 ක් ගෙවා යන්නට ඉඩ හැරියහ. | විස්තර වලට යටත් වන ඕනෑම අවස්ථාවක ස්ත්‍රී දූෂණයක් නොවන ක්‍රියාවක් වීම ... "<br>එවැනි වෙනත් අයෙකු නීත්‍යානුකූල හෝ නීති විරෝධී ලෙස රඳවාගෙන සිටියදී අනෙක් පුද්ගලයාගේ අනුමැතිය ඇතිව.... | | |

**කාඩ් සෙට් 03**

| සිද්ධිය | නීතිය | වගඋත්තරකරුවන් විසින් තීරණය කරන ලද දඬුවම | පවතින නීතිය යටතේ දඬුවම |
|---|---|---|---|
| සංක්‍රාන්ති සමජභාවී කාන්තාවක් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.<br>උපතේදී ලබා දෙන ලිංගිකත්වය ලෙස "පුරුෂයා" දැක්වෙන හැඳුනුම්පතක් තිබියදී කාන්තාවක් ලෙස පෙනී සිටීම හේතුවෙන් ඇයට එරෙහිව චෝදනා ගොනු කිරීමට පොලිසිය උත්සාහ කරයි. | 399 වගන්තිය "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම"<br>යමෙකු වෙනත් තැනැත්තෙකු ලෙස බොරුවට හඟවමින් හෝ වෙනත් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තෙකු දැනුවත් ව පෙනී සිටිමින් හෝ එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නියම වශයෙන්ම එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තෙකු නොව, අන් තැනැත්තෙක් යයි නිරූපණය කරමින් රවටතොත්, ඔහු "අනෙකෙකු ලෙස පෙනී සිටිමින් වංචා කළ ලෙස" සලකනු ලැබේ.<br>පුද්ගලයා සැබෑ පුද්ගලයෙක් හෝ පරිකල්පනීය පුද්ගලයෙක් වුවත් වරද සිදු කෙරේ " | | වසර 0-1 ක සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙකම |
| ප්‍රසිද්ධ වෙළඳ නාම සහිත ඇඳුම් සොරාගැනීමට මිනිසෙක් ඇඳුම් සාප්පුවකට යයි.<br>නමුත් ආරක්ෂක කැමරා වලට හසු නොවීමට ඔහු බුර්කාවක් සහ අත්බෑගයක් පැළඳ කාන්තාවක් ලෙස පෙනී සිටී. | 399 වගන්තිය "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම"<br>යමෙකු වෙනත් තැනැත්තෙකු ලෙස බොරුවට හඟවමින් හෝ වෙනත් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තෙකු දැනුවත් ව පෙනී සිටිමින් හෝ එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නියම වශයෙන්ම එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තෙකු නොව, අන් තැනැත්තෙක් යයි නිරූපණය කරමින් රවටතොත්, ඔහු "අනෙකෙකු ලෙස පෙනී සිටිමින් වංචා කළ ලෙස" සලකනු ලැබේ.<br>පුද්ගලයා සැබෑ පුද්ගලයෙක් හෝ පරිකල්පනීය පුද්ගලයෙක් වුවත් වරද සිදු කෙරේ " | | වසර 0-1 ක සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙකම |
| මාලන් සහ රිචඩ් සමරිසි පෙම්වතුන් ය.<br>ඔවුන් වසර 3 ක් එකට ජීවත් වී ඇත.<br>මාලන් වෘත්තීය නිරූපණ ශිල්පයෙකු වන අතර රිචඩ් මාලන් කෙරෙහි දැඩි සැකයක් ඇති අතර ඔහුට නිතරම | 2005 අංක 34 දරණ ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත (PDVA) 'ගෘහස්ත හිංසනයේ ක්‍රියාවක් සිදු කර ඇති, සිදු වූ හෝ සිදු වීමට ඉඩ ඇති පුද්ගලයෙකුට ("පීඩාවට පත් වූ පුද්ගලයෙකු") එවැනි ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා ආරක්ෂක | | PDVA යටතේ දඬුවම් නොකළ යුතු අතර ආරක්ෂක නියෝගයක් පමණක් නිකුත් කළ හැකිය. |

| | | | |
|---|---|---|---|
| බැණ වදියි. දිනක් සාදයක් නිමවා මාලන් නිවසට පැමිණි විට රිචඩ් දැඩි කෝපයට පත් වී ඔහුට පහර දුන්නේය. | නියෝගයක් ලබාගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය. | | දණ්ඩ නීති සංග්‍රහයේ 310 යටතේ හිංසනයක් නම් වසර 0-1 ක සිර දඬුවමක් හෝ දඩයක් නියම කළ හැකිය. |

**කාඩ් සෙට් 04**

| සිද්ධිය | නීතිය | වගඋත්තරකරුවන් විසින් තීරණය කරන ලද දඬුවම | පවතින නීතිය යටතේ දඬුවම |
|---|---|---|---|
| නලින් 24 හැවිරිදි සමරිසි පුද්ගලයෙකි.<br>දිනක් ඔහු බසයේ වැඩට යන විට ඔහු අසල වාඩි වී සිටි වයසක පුද්ගලයෙක් තම ශිෂ්ණය එළියට ගෙන නලීන්ට සංඥා කර ස්වයං වින්දනය කිරීමට පටන් ගනී. | 345 වගන්තිය: 'ලිංගික හිංසනය' "පහර දීමෙන් හෝ අපරාධ බලය භාවිතා කිරීමෙන්, වෙනත් පුද්ගලයෙකුට ලිංගික අතවර කිරීම, හෝ වචන හෝ ක්‍රියාවන් භාවිතා කිරීමෙන්, වෙනත් පුද්ගලයෙකුට ලිංගික අතවරයක් හෝ හිරිහැර කිරීමක් සිදු කරන්නේ නම්, ලිංගික හිංසනය කිරීමේ වරද සිදු කරයි..." | | අවුරුදු 0-5 ක සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙකම.<br>දිවි ගලවා ගත් තැනැත්තාට උසාවියෙන් වන්දි ලබා දිය හැකිය. |
| මිෂෙල් 24 හැවිරිදි සංක්‍රාන්ති කාන්තාවකි.<br>නිවසේ පැවති සාදයකදී 35 හැවිරිදි කමල් ඇය පසුපස යමින් ඔහු සමග නටන ලෙස ඉල්ලා සිටියි.<br>පසුව මිෂෙල් දැඩි ලෙස බීමත්ව සිටි අතර ඇය බොහෝදුරට අවසිහි මට්ටමට පත් වෙමින් සිටියි..<br>ඇයට පැහැදිලිව සිතීමට නොහැකි තත්ත්වයකට පත් වෙයි.<br>කමල් ඇයව නිදන කාමරයට ගෙන යයි.<br>ඔවුන් ලිංගිකව හැසිරෙයි.<br>ඇයට කමල් සමග ලිංගිකව හැසිරීමට කිසි දිනෙක අවශ්‍ය නොවූ බැවින් සිදු වූ දේ තේරුම් ගත් මිෂෙල් දැඩි ලෙස කලබලයට පත් වෙයි. | 365 බී වගන්තියඃ බරපතල ලිංගික අපයෝජනය<br>'බරපතල ලිංගික අපයෝජනය යනු' පුද්ගලයාගේ අනුමැතියකින් තොරව ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක්, වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන් කිසියම් ක්‍රියාවක් සිදු කිරීමයි"<br>එවැනි පුද්ගලයෙක් මත්පැන් හෝ මත්ද්‍රව්‍ය මඟින් මත් වූ තත්වයක සිටියදී අනෙක් පුද්ගලයාගේ අනුමැතිය ඇතිව.... | | දඩ සහ වන්දි සමඟ වසර 7-20 සිර දඬුවම් |
| ලීනා 35 හැවිරිදි කාන්තාවක්.<br>මයික් ඇගේ 45 හැවිරිදි අසල්වැසියා ය.<br>ඔවුන් මිතුරන් ය.<br>දිනක් මයික් විසින් බීමත් ව සිටිය දී ඇය හමුවට එයි. ලීනා ඔහුට තේ කෝප්පයක් සාදා දෙයි. පසුව මයික් ඔහුට දැඩි තනිකමක් සහ පාලුවක් දැනෙන බව කියා ඇය සමග ලිංගිකව හැසිරීමට උත්සාහ කරයි. | 363 වගන්තියඃ දූෂණය<br>"පහත සඳහන් කවර හෝ විස්තරයකට යටත් වන තත්ත්වයක් යටතේ කාන්තාවක් සමඟ ලිංගික සංසර්ගයේ යෙදෙන පිරිමියෙක්" දූෂණය "කරන බව කියවේ ...<br>කාන්තාවකගේ අනුමැතියක් නොමැතිව | | දඩ සහ වන්දි සමඟ වසර 7-20 සිර දඬුවම් |

| | | | |
|---|---|---|---|
| ලීනා ඔහුව ඉවතට තල්ලු කර එම ක්‍රියාව ප්‍රතික්ෂේප කරයි. නමුත්, ඔහු බලහත්කාරයෙන් ඔහුගේ ශිෂ්ණය ඇගේ යෝනි මාර්ගයට ඇතුළු කර ඇයව දූෂණය කරයි. | | | |

**සටහන්**

- සමරිසි පුද්ගලයන් අතර ලිංගික හැසිරීම අපරාධයක් ලෙස නොසැලකිය යුතු අතර දඬුවම් නොකළ යුතු බව සලකන්න
- කැමැත්ත යනු ලිංගිකත්වය ද, ලිංගික හිංසනය ද යන්න තීරණය කරන කරුණ බව අවධාරණය කිරීම.
- විවිධ ලිංගික දිශානතියන්ගෙන් සහ සමාජභාවයේ අනන්‍යතාවන්ගෙන් යුත් පුද්ගලයින්ට වෙනස් කොට සැලකීම නැවැත්වීම සඳහා පවතින නීතියට ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව පෙන්වා දෙන්න.

# සැසිය 04 පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා පාවිච්චි කරන පාදඩ ආඥා පනත සහ අනෙකුත් නීතීන්

***මෙම සැසිය කවාකාරව රැස්වී සිදුකරන සාකච්ඡාවකි. ශාලාව මැද තනි ඉරක් ඉඳින්න. එහි එක් කෙලවරක් ඔව් ලෙස ද අනෙක් කෙලවර නැත ලෙස ද ගන්න. සහභාගිවන්නන් සම්පත්දායකයාගේ ප්‍රශ්නවලට "ඔව්" හෝ "නැත" ලෙස පිළිතුරු ලබා දී, එම පිළිතුරු අනුව ඉරේ දෙපසට බෙදේ. කෙටි සාකච්ඡාවක් මෙහි දී සිදු වේ.***

### කාලය
මිනිත්තු 30

### ඉලක්ක ගත කණ්ඩායම්
සැසියකට සහභාගිවන්නන් 30ක් පමණ

### අරමුණු
මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන් :
- පාදඩ ආඥාපනත යටතේ වැරදි ලිඛිත ප්‍රකාශ පිළිබඳව
- LGBT+ පුද්ගලයන්ට හිරිහැර කිරීමට හා බිය ගැන්වීමට භාවිතා කරන නීති පිළිබඳව තේරුම් ගනී.

### අවශ්‍ය මෙවලම්
Painters' tape

### සූදානම් වීම
- Painters' tape භාවිත කර කාමරයේ මැද රේඛාව/රවුම සලකුණු කරන්න.
- රේඛාවේ දෙපස  ඔව් සහ නැත යනුවෙන් ලකුණු කරන්න.
- සාකච්ඡාව අවසානයේදී ලබා දිය යුතු අත් පත්‍රිකා.

### පියවර
- මෙම ක්‍රියාකාරකම LGBT+ ප්‍රජාව හිංසනයට ලක් කිරීම සඳහා භාවිතා කරන නීති පිළිබඳ අවබෝධයක් ලබා දීමට සිදු කරන බව පැහැදිලි කරන්න.
- ඔබ ක්‍රියාවන් කිහිපයක් පළමුව කියවා පැහැදිලි කරන බව පවසන්න. එම කියවා පැහැදිලි කරන ක්‍රියාවන් සහභාගී වන්නන් සිතන ආකාරයට දඬුවම් දිය යුතු ක්‍රියාවන් ද, නොදිය යුතු ක්‍රියාවන් ද යන්න පදනම් කරගෙන ඔව් හෝ නැත යන පැති දෙකෙන් එක් පැත්තකට යන ලෙස පවසන්න.
- පිළිතුරු ලබා දුන් අයගෙන් කෙනෙකුට හෝ දෙදෙනෙකුට, මෙම ක්‍රියාවන්ට දඬුවම් කළ යුතුද නැද්ද යන්න ගැන ඔවුන් සිතන්නේ ඇයි දැයි කියා අදහස් දැක්වීමට කියන්න.
- මෙම ප්‍රකාශ කියවන්නඃ

1. ප්‍රසිද්ධියේ සිඟමන් ඇයදීම
2. සමරිසි යුවලක් ප්‍රසිද්ධියේ සිප ගැනීම
3. ලිංගික වෘත්තීන් වලින් ලැබෙන ආදායමෙන් ජීවත් වීම
4. පවුලේ සාමාජිකයෙකු ප්‍රසිද්ධියේ සිඟමන් යැදීමට යෙදවීම
5. පොදු බිත්තියක අශෝභන දෙයක් ඇඳීම
6. ප්‍රසිද්ධියේ යමෙකු ලුහුබැඳීම
7. ශරීරයේ පෞද්ගලික කොටස් නිරාවරණය කිරීම
8. උඩුකය නිරාවරණය කර ගනිමින් කාන්තාවක් ප්‍රසිද්ධියේ ඇවිදීම
9. විකෘති වූ අතක් පෙන්වමින් ප්‍රසිද්ධියේ හිඟාකෑම
10. පොලිස් නිලධාරියෙකු විසින් අත්අඩංගුවට ගැනීමඅ දී ඊට එරෙහි වීම
11. ප්‍රසිද්ධියේ සේවාදායකයෙක් සොයන ලිංගික සේවකයෙක්
12. සමරිසි පුද්ගලයෙක් ප්‍රසිද්ධියේ ලිංගික සම්බන්ධකම් පැවැත්වීම සඳහා යමෙකු සෙවීම

- මෙම සියලු ක්‍රියාකාරකම් පාදඩ ආඥා පනත යටතේ හඳුනාගෙන ඇති බව පැහැදිලි කරන්න.
- පාදඩ ආඥාපනත මගින් යටත්විජිත සමයේ පැවති වටිනාකම් ප්‍රකාශ කරන බව ද පැහැදිලි කරන්න.
- මෙම ආඥාපනත මගින් මිනිසුන්ව නොහික්මුණු පුද්ගලයන්, මැරයන්, තක්කඩින්, ලෙස නම් කර ඇති අතර සිදුකරන ක්‍රියාව නොව එම අදාල පුද්ගලයාව අපරාධයක් ලෙස ගන්නා බව සලකන්න.
- මීට අමතරව LGBT+ පුද්ගලයින්ට හිරිහැර කිරීම සඳහා 1907 අංක 05 දරණ රැඳවුම් නිවාස ආඥාපනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 451 වගන්තිය වන "ප්‍රසිද්ධ සොරෙකු ලෙස ගැවසීම" යන්න ද භාවිතා කරන බව පැහැදිලි කරන්න.
- අත්පත්‍රිකාව බෙදාහැර LGBT+ පුද්ගලයින්ට හිරිහැර කිරීමට භාවිතා කරන මෙම නීති ගැන වැඩිදුර විස්තර ඉගෙන ගැනීමට සහභාගීවන්නන්ව දිරිමත් කරන්න.

## අත් පත්‍රිකාව

**<u>ශ්‍රී ලංකාව තුළ බඨර්ඔ+ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට භාවිතා කරන නීතිය</u>**

**1841 අංක 04 දරන පාදඩ ආඥාපනත**

නිකරුණේ ගැවසීම, නොහික්මුණු ලෙස හැසිරීම, ප්‍රසිද්ධියේ අශික්ෂිත ක්‍රියා සිදු කිරීම සහ ලිංගික වෘත්තියේ යෙදීමේ අරමුණෙන් සැරිසැරීම යනා දී ක්‍රියාවන් අපරාධ ගණයේ ලා සැලකෙන ප්‍රධාන නීතිය මෙය වේ.

ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ සමහර පුද්ගලයින් නිකමුන් හා නොහික්මුණු පුද්ගලයින් ලෙස වර්ගීකරණය කරයි:

- රැකියාවක් හෝ වෙනත් ආදායම් මාර්ගයකින් යැපීමට හැකි සිය කැමැත්තෙන්ම එසේ කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ නොසළකා හරිමින් ප්‍රසිද්ධ ස්ථානයක, වීදියක, මහා මාර්ගයක, ගෙමිදුලක ආහාර එකතු කිරීමෙන් හෝ සිඟා කමින් ගැවසේනම් හෝ එවැනි කාර්‍යයක් සඳහා සිය පවුලේ කවරෙකු හෝ උනන්දු කරවන සෑම පුද්ගලයෙක් ම,
- ප්‍රසිද්ධ වීදියක මහා මාර්ගයක හෝ ප්‍රසිද්ධ වෙනත් ස්ථානයක අයාලේ සහ අනිසි ලෙස හැසිරෙන සෑම ලිංගික වෘත්තිකයෙක්ම,
- සාධාරණ හෝ පැහැදිලි හේතුවක් නොමැතිව අයිතිකරුගේ අවසරයෙන් තොරව පිට ස්ථානයක, ආලින්දයක, මඩුවක හෝ පාලු ගොඩනැගිල්ලක කිසියම් කරත්තයක හෝ පාලු වාහනයක ගැවසෙන සෑම පුද්ගලයෙක්ම,
- අයිතිකරුගේ අවසරය නොමැතිව දැන්වීම් ඇලවීම, අසභ්‍ය හෝ අපහාස ගෙන දෙන දේ ලිවීමෙන් හෝ ඒ පිළිබඳ චිත්‍ර ඇඳීමෙන් කිසියම් නිවසක් හෝ ගොඩනැගිල්ලක් බිත්තියක් විකෘති කරන සෑම පුද්ගලයෙක්ම
- වාප්පුවක, නැව් තොටුපොළක, මාවතක, මාර්ගයක, පදික වේදිකාවක, ආලින්දයක, ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක් තුල පිහිටි වෙනත් ස්ථානයක නීත්‍යානුකූලභාවයෙන් තොර හේතුවක් නොමැතිව ගැවසෙමින් තවකෙකු අනාචාරයේ හැසිරීමට කැඳවන පුද්ගලයෙක්ම

මෙම ආඥා පනතේ අදහස් අනුව නීති විරෝධී අයාලේ යන්නන් ලෙස සැලකේ.

පොලිස් නිලධාරියෙක් හට වරෙන්තුවක් නොමැතිව "අශික්ෂිත හෝ නොහික්මුණු" යැයි සැලකෙන ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැකිය.
1841 අංක 4 දරණ පාදඩ ආඥාපනතේ 7 වන වගන්තිය, ප්‍රධාන වශයෙන් සංක්‍රාන්තික සමජභාවී පුද්ගලයන් සහ සමරිසි පුද්ගලයන්ට එරෙහිව පොදු ස්ථාන වලදී අසභ්‍ය ලෙස හැසිරීම සහ අසභ්‍ය ක්‍රියාවන්ට පොළඹවා ගැනීම යටතේ දඬුවම් කිරීමට යොදාගනී.

07 වන වගන්තියේ මෙසේ සඳහන් වේ:
"7.

a) කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක විශේෂයෙන් සඳහන් කළ හෝ නොකළ පුද්ගලයෙකු සමඟ අසභ්‍ය ලෙස ලිංගික සබඳතාවේ යෙදෙන හෝ අශ්ශීල ලෙස හැසිරෙන ඕනෑම පුද්ගලයෙකු:,
b) යම්කිසි පුද්ගලයෙකු ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක් තුල හෝ අවට කාමුක ක්‍රියාවක් කර අනිසි ලෙස හැසිරී වරදක් කර අසු වුවහොත්
c) ඕනෑම පුද්ගලයෙකු

I ඕනෑම ප්‍රාදේශීය අතුරු නීතියකින් හෝ රෙගුලාසියකින් විස්තර වන ආකාරයට අන්දමට ප්‍රතිවිරුද්ධව ප්‍රසිද්ධ මධ්‍යස්ථානයක් පාවිච්චි කිරීම හෝ
II රජයට අයත් ඕනෑම ස්ථානයක් එම ස්ථානය භාර පුද්ගලයාගේ අවසරය නැතිව හෝ
III ඕනෑම පදිංචි නිවසකට යාබද පුද්ගලික නිවසක් තුළ එම ස්ථානයේ පදිංචි පුද්ගලයන්ගේ ආරාධනයක් නොමැතිව.....

එවැනි තත්වයන් යටතේ ඔහු දුරාචාරමය අරමුණු සඳහා එහි සිටි බව අනුමාන කිරීම සාධාරණ ය, ඔහුට එරෙහිව නඩු විභාග කරන උසාවිය තෘප්තිමත් වන ආකාරයට ඔහු එලෙස රැඳී සිටීමට හේතු පැහැදිලි කිරීමට ඔහුට නොහැකි නම්, වරදකට වරදකරු විය යුතුය, සහ වරදකරු වීමෙන් මාස හයකට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමට, හෝ රුපියල් සියය නොඉක්මවන දඩයකට හෝ ඒ දෙකටම බැඳී සිටී.

පාදඩ ආඥා පනතේ පුරෝකථනය කර ඇති දඬුවම, බරපතලකම සහ සිදු කළ අපරාධ ගණන අනුව වෙනස් වේ ආඥාපනත ආන්තිකරණයට වූ ප්‍රජාවන්ට පමණක් නොව විෂමරිසි පුද්ගලයින්ට ද බලපාන බව සඳහන් කිරීම අත්‍යවශ්‍යය ය. විශේෂයෙන් ප්‍රසිද්ධියේ ආදරයෙන් හැසිරෙන තරුණ යුවළවල්, සිය මුදල් පසුම්බියේ උපත් පාලන කොපු රැගෙන ගිය කාන්තාවන්ට ද මෙම පනත යටතේ චෝදනා ගොනු කළ සිද්ධීන් වාර්තා වේ. ලිංගික වෘත්තිය පිළිබඳ පසුව එන කොටස් වල මේ ගැන වැඩි විස්තර සාකච්ඡා කෙරේ.

පාදඩ ආඥා පනතට අමතරව 1907 අංක 05 දරන රැඳවුම් නිවාස ආඥාපනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 451 වගන්තිය වන "පිලිගත් සොරෙකු ලෙස ගැවසීම" යනාදිය LGBT+ මිනිසුන්ට හිරිහැර කිරීමට යොදා ගැනේ

**1907 අංක 05 දරණ රැඳවුම් නිවාස ආඥාපනත**
මෙම ආඥාපනතේ 02 වන වගන්තිය, පාදඩ ' ගැන පහත පරිදි විස්තර කරයිඃ

" (a) දන් ඉල්ලන ඕනෑම පුද්ගලයෙක්" හෝ
(b) ඕනෑම පුද්ගලයෙකුට තමාගේම ජීවනෝපාය මාර්ගයෙන් ශාරීරිකව උපයා ගැනීමට නොහැකි වීම හෝ වැඩ කිරීමට අකමැති වීම සහ දෘෂ්‍යමාන ජීවනෝපාය මාර්ගයක් නොමැති වීම."ඕනෑම ආගමික පොරොන්දුවක් හෝ බැඳීමක් ඉටු කිරීමේදී දානය එකතු කරන පූජකවරුන් සහ වන්දනාකරුවන් හැර".

මෙම ආඥාපනතේ 10 වන වගන්තියේ සඳහන් වන ආකාරයට, "අයාලේ යන පුද්ගලයෙකු ලෙස පෙනෙන පුද්ගලයෙකු පොලිස් නිලධාරියෙකු විසින් කැටුව යාමට උත්සාහ කරන විට එය ප්‍රතික්ෂේප කරන හෝ ඊට අනුකූලවීමට අපොහොසත් වන විට, සහ අවශ්‍ය වූ විට මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනී සිටින ඕනෑම අයෙකු මෙම ආඥා පනතේ අරමුණු සඳහා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට, සහ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ වරදකරු වුවහොත් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා ඕනෑම විස්තරයක් සිරගත කිරීමට බැඳී සිටින බවයි. "

ආඥා පනතේ 4 වන වගන්තිය මගින් මහේස්ත්‍රාත්වරයා සඳහා විධිවිධාන සලසා ඇත්තේ "වරදකරු වූ හෝ පෙනී සිටින හෝ අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයා ආඥා පනතේ අර්ථය තුළ අයාලේ යන අයෙකු " අදහසට වැටේ නම්, එවැනි පුද්ගලයෙකු රඳවා තබා ගැනීමේ නිවසක රඳවා තබා ගැනීමට නියෝග කිරීම, එයට දඬුවම් දීමට බලය ඇති ඕනෑම දඬුවමක් වෙනුවට හෝ ආදේශ කිරීමටයි."

**451 දණ්ඩ නීති සංග්‍රහය (1883 අංක 2 දරණ ආඥාපනත)ඃ "පිළිගත් සොරෙකු ගැවසීම"**
මෙම වගන්තියේ සඳහන් වන්නේ "පිළිගත් සොරෙකු" වන පුද්ගලයෙක් සොරකම් කිරීමේ අරමුණින් කිසියම් වරායක් හෝ වෙනත් ජලය ඇති, ඕනෑම පොදු ස්ථානයක් හෝ ඕනෑම ස්වාභාවික වරායක් හෝ ගබඩාවක් තුළ හෝ යාත්‍රාවක සැරිසැරීම හෝ සැඟවී සිටිම හෝ වෙනත් කිසියම් නීති විරෝධී ක්‍රියාවකට දඬුවම් නියම කළ යුත්තේ මාස තුනක් දක්වා දීර්ඝ විය හැකි කාල සීමාවක් සඳහා විස්තර කිරීම හෝ රුපියල් පනහ නොඉක්මවන දඩයක් හෝ ඒ දෙකම සමග සිරගත කිරීමෙනි. "

# සැසිය 05 ( ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තිය සම්බන්ධ නීති

***මෙය PPT ස්ලයිඩ්ස් භාවිතා කරමින් සිදු කරන කෙටි දේශනයකි***

**කාලය**

මිනිත්තු 30

**ඉලක්ක ගත කණ්ඩායම්**

සැසියකට සහභාගිවන්නන් 30ක් පමණ

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්
ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තියන්ට අදාළව නීතිය පනවා ඇති බව

**ඉදිරිපත් කිරීම්**

PPT ස්ලයිඩ්ස්

**පියවරයන්**

- සහභාගිවන්නන් ලිංගික වෘත්තිය යනුවෙන් තේරුම් ගෙන ඇත්තේ කුමක්දැයි ඔවුන්ගේ විමසා සැසිය ආරම්භ කරන්න.
- මෙය ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තිය සම්බන්ධව ඇති නීති පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමක් බව පැහැදිලි කරන්න.
- PPT ස්ලයිඩ් භාවිතා කරමින් දේශනය පවත්වන්න.
- සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දෙන්න.

**සටහන්**

ලිංගික වෘත්තිය යන්නෙන් අදහස් කරන්නේ මුදල් (හෝ වෙනත් යහපතක් හෝ ප්‍රතිලාභයක්) වෙනුවට ලිංගික සේවාවන් සැපයීම යන්නයි. ලිංගික වෘත්තිකයෙක් යනු මුදල් සඳහා (හෝ වෙනත් යහපතක් හෝ ප්‍රතිලාභයක්) ඔවුන්ගේ කැමැත්තෙන් ලිංගික සේවාවන් සපයන අයෙකි. ලිංගික වෘත්තිකයන් ජීවනෝපාය බවට පත් කරගෙන ඇත්තේ ලිංගික ශ්‍රමයයි.
සමහර රටවල ලිංගික වෘත්තිය නීත්‍යානුකූල වන අතර කම්කරුවන්ට අදාළ වන කම්කරු අයිතිවාසිකම් ලිංගික වෘත්තිකයන්ට ද අදාළ වේ. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති නීත්‍යානුකූල රැකියාවක නියැලීමට ඇති නිදහස නිතිමය පරිසරය මඟින් සීමා කිරීම හේතුවෙන් ලිංගික වෘත්තිකයන්ට මෙම ආරක්ෂාවන් අදාළ නොවේ.
ලිංගික වෘත්තිය ලිංගික ජාවාරම් හෝ ලිංගික සූරාකෑම් මගින් වෙන් කර හඳුනා ගත යුතු බව සලකන්න.
ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තිකයන් සම්බන්ධයෙන් සීමා සහිත නීතිමය සැලැස්මක් තිබුන ද ,ලිංගික වෘත්තිකයන්ට සියලුම මූලික අයිතිවාසිකම් තවමත් අදාළ වේ. නිදසුනක් වශයෙන්, ලිංගික වෘත්තිකයෙකුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට හෝ වධ හිංසා කිරීමට නොහැකිය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 13 වගන්ති බලන්න). ලිංගික වෘත්තිකයින්ට පොලිසියේ දී, රෝහලක දී හෝ වෙනත් රජයේ ආයතනයක දී හෝ වෙනස් කොට සැලකීමට නොහැකි අතර ඔවුන්ගේ දරුවන්ට ද රජයේ පාසැල් තුළදී වෙනස් කොට සැලකීමට නොහැකිය.

ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තියේ නියැලීම අපරාධයක් නොවේ. පාදඩ ආඥා පනත අනුව ප්‍රසිද්ධියේ ලිංගික වෘත්තියේ නියැලීමෙන් ජීවත් වීම වරදක් වේ. ගණිකා නිවාස ආඥාපනත මඟින් ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම තහනම් කර ඇත.කෙසේ වෙතත්, බොහෝ විට පාදඩ ආඥාපනත භාවිතා කරමින්,පොලිසිය විසින් ලිංගික වෘත්තිකයින්ව බිය ගැන්වීම සහ හිංසා කිරීම, ලිංගික හිංසනයට ලක් කිරීම සිදු වේ.

**පහත දැක්වෙන්නේ මෙම අදාළ නීති විස්තරාත්මකව පරීක්ෂා කිරීමකි:**

**දණ්ඩ නීති සංග්‍රහයේ 360A (1) - 'පුද්ගලයෙකු ලිංගික ශ්‍රමිකයෙකු බවට පත් කර ගැනීම '**

"කවුරුන් හෝ කෙනෙක් - ඕනෑම වයසක පිරිමි හෝ ගැහැණු වන යම් පුද්ගලයෙක් (එවැනි පුද්ගලයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත මිලදී ගැනීමට හෝ මිලදී ගැනීමට උත්සාහ කිරීම, ලිංගික ශ්‍රමිකයෙක් ා බවට පත් කිරීමේ වරද සිදු කරයි"
දඩුවම ා අවුරුදු 2-10 සිර දඩුවම් සහ සමහර විට දඩ මුදලක්.

**ගණිකා නිවාස ආඥා පනත**
ගණිකා නිවාස ආඥා පනත 1889 දී හඳුන්වා දෙන ලදී
01 වන වගන්තියේ මෙසේ සඳහන් වේ:
ඕනෑම පුද්ගලයෙක්
(අ) ගණිකා මඩමක් පවත්වාගෙන යාම හෝ කළමනාකරණය කිරීම හෝ ක්‍රියා කිරීම හෝ සහාය වීම; හෝ
(ආ) කිසියම් පරිශ්‍රයක කුලී නිවැසියා, බදුකරු, පදිංචිකරු හෝ හිමිකරු වීම, දැන දැනම එම පරිශ්‍රය හෝ එහි යම් කොටසක් ගණිකා මඩමක් ලෙස හෝ පුරුද්දක් ලෙස ගණිකා වෘත්තියේ යෙදීමට අවසර දීම; හෝ
(ඇ) කිසියම් පරිශ්‍රයක බදු දෙන්නා හෝ ඉඩම් හිමියා වීම හෝ එවැනි බදු දෙන්නෙකුගේ හෝ ඉඩම් හිමියාගේ නියෝජිතයා වීම, එම පරිශ්‍රය හෝ එහි යම් කොටසක් ගණිකා මඩමක් ලෙස භාවිත කිරීමට හෝ භාවිත කිරීමට නියමිත බව දැනගෙන එම හෝ එහි යම් කොටසකට ඉඩ දෙයි. , හෝ හිතාමතාම එවැනි පරිශ්‍ර හෝ එහි යම් කොටසක් ගණිකා මඩමක් ලෙස අඛණ්ඩව භාවිතා කිරීමේ පාර්ශවකරුවෙකු වන්නේ නම්, වරදකට වරදකරු වේ.

▪ දඩුවම: මාස 0-6 ක සිරදඬුවමක් හෝ දඩයක්

ආඥාපනත මගින් ගණිකා මඩම් යන වචනය අර්ථ දක්වා නැත. කුසෙන් එදිරිව සිසිලියා (37 NLR 308) නඩුවේදී ජස්ටිස් සූට්ස් ප්‍රකාශ කළේ කාන්තාවන් සමඟ ලිංගිකව එක්වීම සඳහා පිරිමින් නිරන්තරයෙන් එම ස්ථානයට පැමිණෙන බව පැමිණිල්ල විසින් ඔප්පු කළ යුතු බවයි.
අබේකෝන් එදිරිව කුලතුංග නඩුවේදී විනිසුරු නාගලිංගම් ප්‍රකාශ කළේ ගණිකා නිවාස ආඥාපනත යටතේ වරදක් ඔප්පු කිරීමට ස්ත්‍රියක් හා පුරුෂයෙක් ස්ථානයක ලිංගිකව එක්වීම ප්‍රමාණවත් නොවන බවයි.

**පාදඩ ආඥාපනත**

9 (1) (අ) වගන්තියේ මෙසේ සඳහන් වේ
සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් දැනුවත්ව ලිංගික වෘත්තියේ ඉපැයීම් මත ජීවත් වන" ඕනෑම පුද්ගලයෙක්
දඩුවම

- මාස 0-6 දක්වා සිර දඩුවමක් හෝ දඩ මුදලක් (සාරාංශ ක්‍රියා පටිපාටිය)
- වසර 0-2 දක්වා සිරගත කිරීම

3 (1) (ආ) වගන්තියේ මෙසේ සඳහන් වේ
පොදු වීදියේ හෝ අධිවේගී මාර්ගයේ හෝ ඕනෑම පොදු නිවාඩු නිකේතනයක සැරිසරමින් කෝලාහල කර හෝ අශෝභන ලෙස හැසිරෙන ලිංගික ශ්‍රමිකයන් 'නිකරුණේ ගැවසෙන හා කලහකාරී පුද්ගලයෙකු ලෙස සැලකේ.

- එය පළමු වරද නම් - දින 0-14 දක්වා සිර දඩුවමක් හෝ දඩ මුදලක් .
- එය දෙවන වරද නම් - දින 0-30 දක්වා සිර දඩුවමක් හෝ දඩ මුදලක් [ 4 (b)]
- එය තුන්වන වරද නම් - මාස 0-4 දක්වා සිර දඩුවමක් හෝ දඩ මුදලක් [ 4 (b)]

7(1) (අ) වගන්තියේ මෙසේ සඳහන් වේ
දඩුවම්

- දින 0-14 දක්වා සිර දඩුවම් හෝ දඩ මුදල්
- ප්‍රායෝගිකව දෙනු ලබන්නේ දඩ මුදලක් පමණි

,sx.sl Y%ñlhska wf,úlrK lghq;= j, " ;u orejka mdi,g /f.k hdu jeks ffoksl l%shdldrlïj, fhfok iuyr wjia:d j,§ o yqfola Tjqka ,sx.sl Y%ñlfhl= f,i fmd,sish úiska y÷kdf.k we;s ksid w;awvx.=jg .kakd nj o jd¾;d fõ'
අතීතයේ දී කාන්තාවන් පාදඩ ආඥා පනත යටතේ අත්අඩංගුවට ගත් අවස්ථා සහ ඔවුන්ගේ මුදල් පසුම්බියේ උපත් පාලන කොපු තිබීම පොලිසිය ප්‍රසිද්ධියේ ලිංගික හැසිරීම් සඳහා පුද්ගලයන් සොයමින් ඇවිදින බවට සාක්ෂි ලෙස භාවිතා කළහ. කෙසේ වෙතත්, උපත් පාලන කොපු රැගෙන යාම මෙම නීතිය යටතේ අපරාධයක් නොවේ. උපත් පාලන

කොපුවක් යනු වෛද්‍ය උපකරණයක් වන අතර එය ලිංගික වෘත්තියේ යෙදුනු බවට සාක්ෂියක් ලෙස භාවිතා කළ නොහැක.
ශ්‍රී ලංකාවේ ලිංගික වෘත්තිය සම්බන්ධ නීති පිළිබඳ වැඩි විස්තර දැන ගැනීම සඳහා මෙම ප්‍රකාශනය බලන්න: ලිංගික ව්‍යාපාර හා HIV/AIDS වැළැක්වීම සම්බන්ධ නීති (ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ලිංගාශ්‍රිත රෝග/ AIDS පාලන වැඩසටහන සහ UNFPA)

https://www.aidscontrol.gov.lk/images/pdfs/books/Laws_Concerning_en.pdf

# සැසිය 06: මිළඟට සිදුවන්නේ කුමක්ද?

*සහභාගිවනන් කණ්ඩායම් දෙකකට බෙදා සිද්ධි අධ්‍යන දෙකක් දෙනු ලැබේ. සිද්ධි අධ්‍යයනය මත පදනම්ව ඔවුන් විනාඩි 5 ක නාට්‍යයක් සකස් කර රඟදක්වයි. මෙම නාට්‍යය පදනම් වී ඇත්තේ ලබා දී ඇති සිද්ධි අධ්‍යයනයෙදී ඔවුන් සිතන දේ මත ය. නාට්‍යයන් ඉදිරිපත් කළ පසු, සම්පත්දායකයා ඒ හා සමාන කථා දෙකක් සහ ඒවායේ අපේක්ෂා කරන ප්‍රතිඵල බෙදාගනී.*

**කාලය**

පැය 1

**ඉලක්ක ගත කණ්ඩායම්**

සැසියකට සහභාගිවන්නන් 30ක් පමණ

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්

- ශ්‍රී ලංකාවේ සිදුවිය හැකි සිද්ධි දෙකක් අවබෝධ කරගෙන තිබිය යුතුය

**සකස් කිරීම**

- PPT ඉදිරිපත් කිරීම්
- Slides -PPT ස්ලයිඩ්ස්
- සිද්ධීන්ගේ මුද්‍රිත පිටපත්

**පියවර**

- මෙය යම් නිර්මාණාත්මක රංගනයකට කාලය බව පැහැදිලි කරන්න.
- ලබා දී ඇති සන්දර්භය/ජවනිකාව තුළ ඊළඟට කුමක් සිදුවේ දැයි රඟදැක්වීමට කණ්ඩායම් දෙකක (එක කණ්ඩායමකට 10-15) සහභාගිවන්නන්ට ආරාධනා කරන්න.
- මෙහි දී  නිවැරදි ප්‍රතිඵලයක් හෝ වැරදි ප්‍රතිඵලයක් ගෙන ඒම බලාපොරොත්තු නොවන බව පැහැදිලි කරන්න - සිදු වනු ඇතැයි ඔවුන් සිතන දේ කරන මෙන් පවසන්න.
- එය හාස්‍යජනක දෙයක් පවා විය හැකි බව පැහැදිලි කරන්න.
- මෙම නාට්‍යය මිනිත්තු 5-10ක් පමණ දිග් විය යුතු බවත්, ඒ සඳහා සූදානම් වීමට ඔවුන්ට විනාඩි 30 ක කාලයක් ලැබෙන බවත් සලකන්න.
- කණ්ඩායමේ සෑම කෙනෙකුම රංගනයේ යෙදීම අවශ්‍ය නොවන බව සහ කැමති අය පමණක් රංගනයේ යෙදීම ප්‍රමාණවත් බවද පවසන්න.
- නාට්‍යක් සංවර්ධනය කිරීමේදී නළු නිළියන් පමණක් නොව පිටපත් රචකයින්, අධ්‍යක්ෂවරුන්, අතිරේක ශිල්පීන් ඇතුළු බොහෝ දෙනා සිටිය හැකි අතර යමෙකුට මේ ඕනෑම භූමිකාවක් භාර ගත හැකිය.
- කණ්ඩායමකට පොලිස් නිලධාරින්, විනිසුරුවරයෙකු සිටිය හැකි බව ද පැහැදිලි කරන්න
- සමහර විට එකිනෙකාට එකඟ නොවන විනිසුරුවරුන් 2-3 ක්, චූදිත පුද්ගලයා සහ ඕනෑම සැබෑ හෝ පරිකල්පනීය චරිතයක් සිටිය හැක.
- කතාවට ආරම්භයක්, මැදක් සහ අවසානයක් තිබිය යුතු බව පැහැදිලි කරන්න
- නාට්‍ය දෙක අවසන් වූ පසු සෑම කණ්ඩායමකටම අත්පොළසන් නාදයක් ලබාදී සහභාගී වීම අගය කරන්න.
- නීතිය ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ පද්ධතිය මගින් ලිංගික වෘත්තිකයින්ට සලකන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගිවන්නන් තුල අවබෝධයක් ඇති කරන්න.
- නාට්‍ය වලින් පසු, සැබෑ නඩු උසාවියට ගිය විට සිදු වන දේ කෙටියෙන් පැහැදිලි කරන්න.
- සම්පත්දායකයා හට අදහසක් : සහභාගිවන්නන් අදාල කරුණු ඉස්මතු නොවන ලෙස රඟ දක්වයි නම් එක නාට්‍යයකට. "සුළු ලිංගික සම්බන්ධකමක් පවත්වා ඇත" වැනි කරුණක් ඇතුළත් කරන ලෙස පවසන්න.එයින් සහභාගිවන්නන් හට සාකච්ඡා කරන කරුණු පිළිබඳ මනා අවබෝධයක් ලැබෙනු ඇත.

## සටහන්

### ජවනිකාව 01

රෝස් ලිබර්ටි ප්ලාසාහි මහල් නිවාස 2 ක් ඇත. එක් මහල් නිවාසයක් අනෙකට ඉහළින් පිහිටා ඇත. ලිංගික වෘත්තිකයින්ට සහ සේවාදායකයින්ට එක්වීමට ස්ථානයක් ලබා දීම සඳහා ඇයට ව්‍යාපාර අදහසක් එයි, එයින් ඇය කොමිස් මුදලක් ලබා ගනී. පොලිසියට මේ ගැන ආරංචි වන අතර තත්ත්වය පිළිබඳ සැක කරයි. ඔවුන් කොස්තාපල් ඩග්ලස්ව සේවාදායකයෙකු ලෙස අන්දවා ඩග්ලස්ව එය පරීක්ෂා කිරීමට යවයි. ඩග්ලස් පළමු මහලට යයි. රෝස් ඔහුට ආචාර කරන අතර ලිංගික ශ්‍රමිකයින් කිහිප දෙනෙකු කැඳවා ඔවුන්ගෙන් එක් අයෙකු තෝරා ගන්නා ලෙස ඩග්ලස්ට පවසයි. ඩග්ලස් නාලිනීව තෝරන අතර රෝස් රු. 3000 දෙන ලෙස ඩග්ලස් කියයි. ඔහු රු. 3000 දෙයි. පසුව නාලිනී ඔහු සමඟ පහත ඇති මහල් නිවාසයට යයි. ඩග්ලස් පොලීසියට කථා කර පොලිසිය විසින් රෝස්ගේ නිවස වටලයි. නඩුව උසාවියට යයි. ඊළඟට කුමක් සිදුවේද?

### ජවනිකාව 02

විජය පොලිස් නිලධාරියෙකි. වැඩ අවසන් වූ දිනක ඔහු මත්පැන් මදක් පානය කර ගෙදර බලා තම වාහනය පදවාගෙන යයි. මඟදී විජය තම වාහනයේ පිටුපස අසුනට ලිහාන්ව නංවා ගනී. විජය මද වේලාවක් වහනය පදවා වාහන නැවතුම් ස්ථානයක නවතා ලිහාන් සමඟ පසුපස අසුනට ගොඩ වේ. ඔවුන් මුඛ ලිංගික ඇසුරක් පවත්වයි. පසුව ලිහාන් කාරයෙන් බැස යයි. ලිහාන් සමරිසි පුද්ගලයෙකු විය හැකි යැයි යන හැඟීමක් ඒ හරහා ගමන් කරන පොලිස් නිලධාරීන් දෙදෙනෙකු තුළ ඇති වේ.

වෑන් රථය අසලට එන විට පොලිස් නිලධාරීන් දුටුවේ විජය පිටුපස අසුනේ සිට ඇඳුම් අඳින බවය. ඔවුන් විජයට එළියට එන්න කියයි. විජය ඔබ මට මේ ආකාරයට සලකන්නේ කෙසේදී කියා ඔවුන් සමඟ කෝලාහල කරයි. නිලධාරීන් විජය අත්අඩංගුවට ගනී. ලිහාන් සහ විජය මුඛ ලිංගික සංසර්ගයේ යෙදෙනු දුටු බව ප්‍රකාශයක් ලබා දෙන ලෙස අසල කුඩා තේ කඩයක් පවත්වාගෙන යන වැඩිහිටි පුද්ගලයෙකුගෙන් පොලිස් නිලධාරීන් ඉල්ලා සිටින අතර පොලිසියට මෙය වාර්තා කළේ ඔහු විසින් යැයි පවසන මෙන් ඉල්ලා සිටී. නඩුව උසාවියට යයි. ඊළඟට කුමක් සිදුවේද?

### <u>නඩුව 01 රෝස්මරි ජූඩ් පෙරේරාට එරෙහිව රාජ්‍යය නඩු තීන්දුව.</u>

**නඩුවේ කරුණුඃ**

මුදලට ලිංගික සංසර්ගය සඳහා කාන්තාවන් ලබා දුන් චෝදනාවට සම්බන්ධ සැකකරු කොළඹ අපරාධ කොට්ඨාසයේ (කක) නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ. කොල්ලුපිටිය ලිබර්ටි ප්ලාසා සාප්පු සංකීර්ණයේ මහල් නිවාසයකදී ඇය තවත් කාන්තාවන් අට දෙනෙකු සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**විනිශ්චයඃ**

රෝස්මේරි ෆෙලිසියා පෙරේරා නොහොත් ජීනා මැඩම්ට කොළඹ මහාධිකරණය නියම කළ දඬුවම සහ තීන්දුව අත්හිටුවීමට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කර තිබේ. ලිංගික ශ්‍රමිකයන් සැපයීමේ වරදට අත්අඩංගුවට ගත් රෝස්මරි ෆෙලීෂියා පෙරේරාව නිදහස් කරන ලෙස පවසමින්ස් ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලෙන් වැඩි දෙනෙකු 2012 නොවැම්බර් 09 තීන්දුව දෙන ලදි. මහාධිකරණය විසින් විත්තිකරු වරදකරු කර තිබූ අතර වසර 3 ක සරල සිර දඬුවමක් සහ රුපියල් 25,000 ක දඩයක් නියම කර තිබුණි.

**ඉගෙන ගත හැකි දේඃ**

විනිසුරු බුවනෙක අලුවිහාරේ සහ විනිසුරු L.T.B. දෙහිදෙනිය නිරීක්ෂණය කරන ලද්දේ අදාළ තැනැත්තිය දැනටමත් ලිංගික ශ්‍රමික කාන්තාවක් නිසා ඉහත වරදට වැරදිකාරිය කල නොහැකි බවයි.

360 ඒ (1) වගන්තිය විශ්ලේෂණය කිරීමේදී මට පෙනී යන්නේ ව්‍යවස්ථාදායකයේ අරමුණ පුද්ගලයාගේ නිර්මලකමට වඩා සදාචාරය පිළිබඳ මහජන අවශ්‍යතා ආරක්ෂා කිරීම බවයි. (නීතියේ) පරමාර්ථය වන්නේ දඬුවම් සම්බාධක පැනවීම සහ ගණිකාවන් ලෙස මේ දක්වා රැකියාවල නිරත නොවූ පුද්ගලයින් ගණිකා වෘත්තියට සම්බන්ධ කර ගැනීම හෝ මිනිසුන් පොළඹවා ගැනීම අධෛර්යමත් කිරීම බව අලුවිහාරේ මහතා වැඩිදුරටත් පැවසීය.

සම්පූර්ණ නඩුව සඳහා
http://www.supremecourt.lk/images/documents/sc_appeal_154_2014.pdf

## නඩුව 02( විමලසිරි එදිරිව භාර නිලධාරී (ස්ථානාධිපති), මරදාන පොලිස් ස්ථානය සහ තවත් (2016)

**නඩුවේ කරුණු**

සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 365 ඒ වගන්තිය අනුව දැඩි අශෝභන ක්‍රියාවක් සිදු කළ බවට චෝදනා කරමින් මරදාන පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ විමලසිරිට සහ (R. ජෙගනාදන්) තවත් අයෙකුට චෝදනා එල්ල කරන ලදී..
මෙම සිද්ධියේ බරපතල අශෝබන ක්‍රියාවක් ලෙස සලකා ඇත්තේ, වාහන නැවැත්වීමේ ස්ථානයක නැවැත්වූ වෑන් රථයක් තුළ (පසුපස අසුනේ) කැමැත්ත ලබාදීමේ වයසේ සිටි (ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද) වැඩිහිටි පිරිමින් දෙදෙනෙකු අතර සිදු වූ මුඛ සංසර්ග හැසිරීමකි.
චූදිත පාර්ශවය වැරදිකරුවන් බව තහවුරු කළ නඩු විභාගය සිදු කළ මහේස්ත්‍රාත්වරයා එම දෙදෙනා වරදකරුවන් කර වසරක සහ තවත් මාස 6 ක සිර දඬුවමක් සහ දඩයක් (රු:1500/- ක) නියම කරන ලදී..

**ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනයේදී:**

විනිසුරු අලුවිහාරේ පැහැදිලි කල පරිදි 365 A වගන්තියේ ගුදමාර්ග ලිංගික සංසර්ගය සම්බන්දයෙන් පවතින අතර එය පොදු සදාචාරය සුරැකීම සම්බන්දයෙන් පැවති එංගලන්තයේ නීති වල කොටසක් බවය. 2004 වසරේ සිදු කරන ලද ලිංගික අපරාධ පනතේ සංශෝධනය මගින් දැඩි අශෝබන ක්‍රියා සහ ගුද සංසර්ගය එංගලන්ත අපරාධ ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. වැඩිහිටියන් අතර එකගත්වයෙන් යුතු ලිංගික හැසිරීම් රජය විසින් පාලනය නොකළ යුතු අතර අපරාධකරණය සඳහා හේතු නොවිය යුතු යැයි යන සමකාලීන චින්තනය, වසර ගණනාවක් තිස්සේ වර්ධනය වී ඇති බව පෙනේ. එය එංගලන්තයේ මෙම නීති වෙනස් කිරීමට හේතු වී ඇතැයි සිතිය හැක.කෙසේ නමුත් මෙම වරද ශ්‍රී ලාංකීය නීතියේ ලෙස දැනටත් පවතී.
විනිසුරු අලුවිහාරේ විසින් මෙම නඩු තීන්දුව සම්බන්දයෙන් ප්‍රකාශ කරන ලද්දේ විමලසිරිට සහ අනෙක් වින්තිකරුට පෙර වරදක ඉතිහාසයක් නොමැති නිසා භාරකාර සිරදඬුවම් නියම කිරීම වරදේ ස්වභාවයට නොගැළපෙන බවයි. විශේෂයෙන්ම මෙය දෙදෙනාගේ කැමැත්ත මත සිදුවීම නිසා එවැනි දඬුවමක් අනවශ්‍යය බව ඔහු පවසා සිටියේය.
ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වසරක සිරදඬුවම ඉවත් කර ඒ වෙනුවට වසර දෙකක බරපතල වැඩ සහිත සිර දඬුවම් නියම කර එය මහේස්ත්‍රාත් අධිකරණයේ දී සිර දඬුවම් නියම කල දිනයේ සිට අත්හිටුවීමට නියෝග කරන ලදී. මෙම නඩු තීන්දුව ලබාදෙන විට සිද්ධිය සිදු වී වසර 13 ක් ගත වී තිබුණි. එමෙන්ම විමලසිරිගේ අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ඉගෙන ගත හැකි දේ :

විනිසුරු අලුවිහාරගේ මතය වැඩිහිටියන් අතර එකගතාවයෙන් යුතු ලිංගික හැසිරීම රජය විසින් පාලනය නොකළ යුතු අතර අපරාධාකරණය සඳහා හේතු නොවිය යුතු යැයි යන සමකාලීන චින්තනය, වසර ගණනාවක් තිස්සේ වර්ධනය වී ඇති බව පෙනේ. එය එංගලන්තයේ මෙම නීති වෙනස් කිරීමට හේතු වී ඇතැයි සිතිය හැක.
විමලසිරි වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සාලිය පීරිස් කියා සිටියේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට පවතින නීති වෙනස් කිරීමට නොහැකි වුවත් කැමැත්ත ලබා දීමට හැකි වයසේ සිටින වැඩිහිටියන් අතරේ සිදුවන ලිංගික ක්‍රියාවන් අපරාධයක් නොවන බවට විනිසුරු අලුවිහාරේ ලබා දුන් මතය ශ්‍රී ලංකාවේ නීතිය වෙනස්විය යුතු ආකාරය පිළිබඳ ඉතා හොඳ දර්ශකයක් බවයි'. වුල්ෆෙන්ඩන් වාර්ථාව ලෙස හැඳින්වෙන සමලිංගික අපරාධ සහ ලිංගික වෘත්තීය පිළිබඳ

දෙපාර්තුමේන්තුකාරක සභාවේ වාර්ථාව උපුටා දක්වමින් ඔහු පෙන්වා දී ඇත්තේ එවැනි ක්‍රියාවන් මහජන සාමයට හෝ මහජනයාට හානියක් නොකරන්නේ නම් රජය ඊට මැදිහත් නොවිය යුතු බවයි. වාර්ථාවේ නිර්දේශ කර ඇත්තේ පුරවැසියන්ගේ පෞද්ගලික ජීවිතයට මැදිහත්වීම හෝ කිසියම් හැසිරීම් රටාවක් බලාත්මක කිරීම නීතියේ කර්තව්‍යයක් නොවන නිසා කැමැත්ත ලබාදිය හැකි වයසේ සිටින වැඩිහිටියන් දෙදෙනෙකු අතර පෞද්ගලික ස්ථානයක සිදුවන සමරිසි ක්‍රියාවන් තවදුරටත් අපරාධ වරදක් නොවිය යුතු බවයි. තවදුරටත් ජනාධිපති නීතිඥ පීරිස් ප්‍රශ්න කර සිටියේ 365 වගන්තියේ සඳහන් වන "ස්වභාව ධර්මයට එරෙහිව සිදුවන ක්‍රියා" යන්නට විද්‍යාත්මක පසුබිමක් ලබාදිය හැකි ද යන්නයි. එමෙන්ම "ස්වභාව ධර්මයට එරෙහිව" යන අදහස වැරදි සදාචාරාත්මක උපකල්පනයක් මත පදනම්ව ඇති බව පෙන්වා දුන් ඔහු පුද්ගලයන්ට විවිධ ලිංගික දිශානතීන් තිබෙන බවද පවසා සිටියේය

සම්පූර්ණ නඩුව සඳහා - http://www.supremecourt.lk/images/documents/sc_appeal_32_11.pdf

මෙම නීති භාවිතා කරමින් බොහෝ සමරිසි , ද්විරිසි සහ සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන් බිය ගැන්වීම් වලට,අත්අඩංගුවට ගැනීම් වලට සහ කප්පම් ගැනීම් වලට භාජනය වන බව සැලකිල්ලට ගත යුතුය . එලෙස තර්ජනය කිරීම් වලට හෝ කප්පම් ගැනීම් වලට මුහුණ දුන් පුද්ගලයින් යුක්තිය ලබා ගැනීම සඳහා කටයුතු කරන්නේ ඉතා කලාතුරකිනි. මෙම නිතිය යටතේ පොලිසිය විසින් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ඔවුන් නිදහස් කිරීම සඳහා ලිංගික සේවා, මුදල් හෝ වෙනත් වටිනා භාණ්ඩ ලබා දෙන ලෙසට බලපෑම් කල සිද්ධි පිලිබඳව වාර්ථා වී ඇත.
ලිංගික ශ්‍රමික කාන්තාවන් සහ සංක්‍රාන්ති සමජභාවී කාන්තාවන් අත්අඩංගුවට ගත අවස්ථාවන් වලදී පොලිස් නිලධාරීන් විසින් ගායනා කිරීමට, නර්තනය කිරීමට හා ඇඳුම් ඉවත් කිරීමට බලපෑම් කල අවස්ථා පිලිබඳව ද තොරතුරු ලැබී ඇත. සමහර අවස්ථා වලදී අත්අඩංගුවට ගත පුද්ගලයින් වෙත දරුණු ලෙස පහර දී ඇත. පොලිස් අත්අඩංගුවේ සිටීමේ දී මෙවැනි ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දීම වධ හිංසා පැමිණවීමට සමාන වන අතර , එවැනි වධ හිංසා වලින් නිදහස්වීම ශ්‍රී ලංකාව තුල මුලික මානව අයිතිවාසිකමකි. කෙසේ වෙතත් බොහෝ අවස්ථා වලදී මෙවැනි වධ හිංසා වාර්ථා නොවන අතර අපරාධකරුවන් නිදැල්ලේ සිටී.

# සැසිය 07 ( අත්අඩංගුවට ගැනීම් සම්බන්ධව ඇති නීති සහ එම නීති භාවිතා වන ආකාරයන්

*මෙය PPT ආධාරයෙන් සිදු කරන කෙටි දේශනයකි.*

**කාලය**

මිනිත්තු 30

**ඉලක්ක ගත කණ්ඩායම්**

එක් සැසියකට අසන්න වශයෙන් සහභාගිවන්නන් 30 කට පමණ

**අරමුණු**

සැසිය අවසානයේ සහභාගිවන්නන් පහත කරුණු අවබෝධ කර ගෙන තිබිය යුතුයි.

- ශ්‍රී ලංකාව තුළ අත්අඩංගුවට ගැනීම් සඳහා පනවන නීති

**සූදානම් වීම**

- PPT ස්ලයිඩ්ස්

**පියවරයන්**

- මෙය ලංකාවේ අත්අඩංගුවට ගැනීම සම්බන්ධ නීති පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමක් බව පැහැදිලි කරන්න.
- PPT ස්ලයිඩ්ස් වල සහාය ඇතිව දේශනය පැවැත්වීම
- සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දෙන්න

**සටහන්**

පාදඩ ආඥා පනත යටතේ වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරියෙකුට හැකි බව ඉහත සඳහන් කර ඇත. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ද වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට හැකි බව සඳහන් වේ.
කෙසේ වෙතත්, වරෙන්තුවක් නොමැතිව එවැනි පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්තේ නම් අත්අඩංගුවට ගත් තැනැත්තාට යම් යම් ආරක්ෂාවන් සපයනු ලැබේ .

**අපරාධ නඩු විධාන සංග්‍රහ පනත (1979 අංක 15)**

37 වන වගන්තියෙහි එය පහත පරිදි දක්වනු ලැබේ

B - වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම

37 වන වගන්තිය : අත්අඩංගුවට ගත් පුද්ගලයා පැය විසිහතරකට වඩා රඳවා නොගත යුතුය
ඕනෑම සාම නිලධාරියෙකු විසින් වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත් පුද්ගලයෙකු නඩුවේ සියලු තත්වයන් සාධාරණ වන කාලයට වඩා වැඩි කාලයක් අත්අඩංගුවේ තබා නොගත යුතු අතර, එවැනි කාලසීමාව සඳහා අවශ්‍ය කාලය හැර පැය විසිහතරක් නොඉක්මවිය යුතුය.

**1866 අංක 07 දරණ පොලිස් ආඥාපනත**

පොලිස් ආඥාපනතේ මෙසේ සඳහන් වේ

65 වැනි වගන්තියඃ "වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත් පුද්ගලයන් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන තුරු හෝ ඇප ලබා දෙන තුරු පොලිස් ස්ථානයට ගෙන යනු ලැබේ

"වරෙන්තුවකින් තොරව කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් අත්අඩංගුවට ගන්නා ලද සෑම පුද්ගලයෙකුම (ඔවුන්ගේ නම සහ පදිංචිය දැනගැනීමේ අරමුණින් රඳවාගෙන සිටින පුද්ගලයින් හැර) එම පුද්ගලයා සුරක්ෂිත කිරීම සඳහා වහාම ස්ථාන භාර නිලධාරියාගේ භාරයට භාර දිය යුතුය. ඔහුව නීතියට අනුව කටයුතු කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකු හමුවට ගෙන ඒමට හැකි වන තුරු හෝ මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පෙනී සිටීම සඳහා ඇප ලබා දෙන තුරු, භාර නිලධාරියා මින්පසු සඳහන් කර ඇති පරිදි ඇප ගැනීම නුවණට හුරු යැයි සලකන්නේ නම්ඃ ඇප නොමැති විට සෑම විටම ප්‍රමාදය නොවැළැක්විය හැකි තත්ත්වයක් ඇති වුවහොත් මිස, සිරකරුවා පැය විසිහතරක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතුය.

වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගැනීම් වලදී නීතිය මගින් මෙම ආරක්ෂාව සපයා ඇතත්, ප්‍රායෝගිකව ආන්තික ප්‍රජාවන් ඉලක්ක කිරීමට/ක්‍රියාපටිපාටියේ අක්‍රමිකතාවලට ලක් වීමට නැඹුරු වේ.

පෙර සැසියකදී පැහැදිලි කළ පරිදි, ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගත් ඕනෑම පුද්ගලයෙකුට පහත සඳහන් ආරක්ෂාවන් ඇත

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, රඳවා තබාගැනීම් සහ දඬුවම්වලින් නිදහස.

   මේ යටතේ ඇති සමහර විධිවිධාන වලට ඇතුළත් වන්නේඃ

- නීතිය මගින් ස්ථාපිත කර ඇති ක්‍රියා පටිපාටිය අනුව ඇරෙන්න කිසිවෙකු අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතුය.
- අත්අඩංගුවට ගත් ඕනෑම පුද්ගලයෙකුට අත්අඩංගුවට ගැනීමට හේතුව දැනුම් දිය යුතුය.
- අත්අඩංගුවේ සිටින, රඳවාගෙන සිටින හෝ වෙනත් ආකාරයකින් පුද්ගලික නිදහස අහිමි වූ සෑම පුද්ගලයෙකුම නීතියෙන් ස්ථාපිත ක්‍රියා පටිපාටියට අනුව ළඟම ඇති නිසි උසාවියේ විනිසුරුවරයා හමුවට ඉදිරිපත් කළ යුතු අතර, පසුව හැර අත්අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ පුද්ගලික නිදහස අහිමි කිරීම නොකළ යුතුය.
- වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින ඕනෑම තැනැත්තෙකුට, නිසි අධිකරණයක් විසින් සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකව හෝ නීතිඥයෙකු විසින් විභාග කිරීමට හිමිකම් ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ වධ හිංසාවෙන් නිදහස් කර සහතික කරනු ලැබේ. මෙහි තේරුම නම්, කිසියම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා දීම සඳහා අත්අඩංගුවේ සිටින පුද්ගලයෙකුට ඕනෑම ආකාරයක ශාරීරික හෝ මානසික වශයෙන් දැඩි වේදනාවක් ලබාදිය නොහැකි බවයි. පහර දීම, ආහාර හෝ ජලය නොදීම හෝ මානසික හිරිහැර කිරීම මෙයට ඇතුළත් ය.

  වධහිංසාවට එරෙහි සම්මුතිය සහ 1994 අංක 22 දරණ වෙනත් කුරිරු අමානුෂික හෝ පහත් ලෙස සැලකීමේ දඬුවම්වලට එරෙහි පනතේ සඳහන් වන්නේ වධහිංසා සිදු කිරීමේ චෝදනාවට වරදකරු වූ ඕනෑම අයෙකුට වසර 7-10 ක සිර දඬුවමක් නියම කරනු ලැබේ.

**මානසික උපදේශන**

වධ හිංසා වලින් නිදහස් වීම පිළිබඳ වීඩියෝ පට දෙකක් පෙන්වමින් මෙම සැසිය අවසන් කරන්න. වීඩියෝ මෙතනින් ලබා ගත හැකඃ

ලින්ක් එක මෙතනින්

# සැසිය 08 එකඟ වීම හෝ එකඟ නොවීම

*යම් ප්‍රකාශයක් සමඟ එකඟ වන්නේද එකඟ නොවන්නේද යන්න පිළිබඳව අවබෝධ කර ගැනීමට සහ තීරණය කිරීමට සහභාගිවන්නන්ට අවස්ථාව ලැබේ.*

## කාලය

මිනිත්තු 30

## ඉලක්ක ගත කණ්ඩායම්

සැසියකට සහභාගිවන්නන් 30ක් පමණ

## අරමුණු

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන් හට,

- තවමත් පවතින ආකල්ප, අගයයන් සහ උපකල්පනයන් ගවේශය කිරීම
- තමන්ගේම පක්ෂග්‍රාහීභාවය ගැන ප්‍රශ්න කරන්න.
- විවිධ SOGIESC ඇති පුද්ගලයින්ගේ සමානාත්මතාවයට එරෙහි ඇති තර්ක විතර්ක පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

**අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය**

- Painters' tape

## සූදානම් වීම

- painters' tape වලින් කාමරයේ මැද රේඛාව/රවුම සලකුණු කරන්න.
- රේඛාවේ දෙපස ඔව් සහ නැත යනුවෙන් ලකුණු කරන්නග

## පියවරයන්

- මෙම අවසන් අභ්‍යාසයේදී ඔබ යම් යම් ප්‍රකාශයන් දෙස බලන බවත්, සහභාගිවන්නන් එකඟ වන්නේද එකඟ නොවන්නේද යන්න තීරණය කළ යුතු බවත් පැහැදිලි කරන්න. ප්‍රකාශයන්ට එකඟ වන්නේද එකඟ නොවන්නේද යන්න මත පදනම් කරගෙන සහභාගිවන්නන්ට ඔව් හෝ නැති පැති දෙකෙන් එක් පැත්තට යන ලෙස පවසන්න.
- පහත සටහන් කොටසේ ඇති ප්‍රකාශයන් කියවන්න සහ සහභාගිවන්නන්ට ඔවුන්ගේ නිදහසේ හැසිරෙන්න ඉඩ දෙන්න
- එක් පැත්තකට සහභාගිවන්නන් නොමැති නම්, සමබර සාකච්ඡාවක් පවත්වා ගැනීම සඳහා එම සහභාගිවන්නන් නොමැති පැත්තට යාමට සහභාගිවන්නන් උනන්දු කරවන්න.
- එකඟ වීමට හෝ එකඟ නොවීමට හේතු පැහැදිලි කිරීමට සහභාගිවන්නන් දෙන්නෙක්ට හෝ තුන්දෙනෙකුට කියන්න. සෑම ප්‍රතිචාරයකින්ම අනෙක් පාර්ශයවෙන් යමෙකුට ප්‍රතිචාර දැක්වීමට ඉඩ දෙන්න. දෙපර්ශයවෙන්ම වලංගු තර්ක ඉදිරිපත් කිරීමට දිරිමත් කරන්න.
- එවැනි අවස්ථාවකදී එක් එක් ප්‍රකාශය යටතේ සාකච්ඡාව අවසන් කිරීම සඳහා පහත දැක්වෙන සටහන් කොටසේ ඇති තර්ක ඔබට භාවිතා කළ හැකිය.

## සටහන්

| ප්‍රකාශයන් | තර්ක |
|---|---|
| LGBT+ පුද්ගලයින් සම්බන්ධයෙන් ලංකාවේ ඇති නීති වෙනස් කිරීමට උත්සාහ කිරීම එය කිසි දිනෙක සිදු නොවන බැවින් කාලය නාස්ති කිරීමකි. | නීති ප්‍රතිසංස්කරණ ගෙන ඒමේ ක්‍රියාවලිය දිගු කාලීන වගකීමකි. මේ සඳහා දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩ උත්සාහයක් දැරීමට අවශ්‍යය වේ. ප්‍රජාවන් බලමුලු ගැන්වීම සහ වැඩි වෙමින් පවතින ජනතාව දැනුවත් කිරීම මෙම ක්‍රියාවලියට දායක වේ. |
| ලිංගික ක්‍රියාකාරකම් නීති විරෝධී විය යුතුයි. | ලිංගික වෘත්තියේ යෙදීම අපරාධයක් ලෙස සැලකුවේ වික්ටෝරියානු සදාචාරයන් මත පදනම් වෙමිනි. ලිංගික වෘත්තිකයින් එම ඊකියාව ස්වේච්ඡාවෙන් සිදු කරන අතර, පවතින නීති මගින් සිදුවන්නේ ලිංගික වෘත්තිකයින් හිරිහැරයට භාජනය වීමයි. ලිංගික වෘත්තියේ යෙදීම නිර් අපරාධීකරණයට ලක් කිරීම ඔවුන්ට මානව හිමිකම්වලට ඇති අයිතිය තහවුරු කිරීමකි. |
| දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 A වගන්තිවල අස්වාභාවික වැරදි සහ පුද්ගලයන් අතර දරුණු අශෝභන ක්‍රියා අපරාධ ලෙස සලකන වගන්ති වෙනස් කළ යුතු නොවන්නේ ඒවා කලාතුරකින් භාවිතා වන බැවිනි. | මෙම නීතිය අවම වශයෙන් භාවිතා කළත්, මෙම නීතිය මගින් LGBT+ පුද්ගලයින් වෙනස් කොට සැලකෙන අතර ඔවුන්ගේ සමානාත්මතාව සඳහා ඇති අයිතිය උල්ලංඝනය කරයි. |
| 365 සහ 365 A වගන්ති අවලංගු කිරීම - එනම් අස්වාභාවික වැරදි සහ පුද්ගලයන් අතර දරුණු අශෝභන ක්‍රියා දරුවන්ට ඇති අවදානම වැඩි වීමට හේතු විය හැක.. | ළමා ලිංගික අපයෝජන සම්බන්ධයෙන් ඇති නීති කිහිපයක් යටතේ ළමයින්ව ආරක්ෂා කෙරේ. |
| ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා ඕනෑම පුද්ගලයෙකු දූෂණය කළ අවස්ථා වලදී දූෂණය සම්බන්දයෙන් ඇති නීතිය ක්‍රියාත්මක විය යුතුය | මෙය වලංගු ප්‍රකාශයකි , මන්ද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යන්නෙන් අදහස් කරන්නේ ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සියලු පුද්ගලයින්ට එක හා සමානව සැලකිය යුතු බවයි. පුරුෂයින් සහ සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන් දූෂණය කිරීම නීතියට අනුව දූෂණය කිරීමක් ලෙස සලකන්නේ නැත. |
| තමන් විසින්ම සමාජභාවය හඳුනා ගැනීම මත පමණක් පදනම්ව සමාජභාවය වෙනස් කිරීමට ඉඩ ලබා දිය යුතුය. මනෝවිද්‍යාත්මක ඇගයීම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත | සමාජභාවය හඳුනා ගැනීම ස්වයං දැනුවත්භාවයේ කොටසක් වන අතර එබැවින් තමාගේම අවබෝධය ප්‍රමාණවත් විය යුතුය. මනෝ ඇගයීමක් අවශ්‍ය වීම සාමාන්‍ය නොවන ස්ත්‍රී පුරුෂ අනන්‍යතා ව්‍යාධි විද්‍යාවේ ශේෂයකි. |
| සමහර විට තොරතුරු ලබා ගැනීම සඳහා පොලිස් භාරයේ සිටින සැකකරුවෙකුට පහර දීම වරදක් නොවේ. | ජාතික සහ අන්තර්ජාතික නීති මගින් සියලුම ආකාරයේ වධහිංසා සිදු කිරීම අපරාධ ලෙස සලකයි. නීතිය පවතින්නේ බලය අවභාවිතා කිරීමෙන් ආරක්ෂා කිරීමටයි. |
| සමරිසි කාන්තාවන්ට දරුවන් අරන් හදා ගැනීමට අවසර ලබා දුන් නමුත් සමරිසි පිරිමින්ට එයට අවසර ලබා නොදිය යුතුය. | ලිංග භේදයකින් තොරව සියලුම දෙමාපියන්ට දරුවන් අරන් හදා ගැනීමට අවසර ලබා දිය යුතුය. පිරිමින්ට එම ප්‍රතිපත්තියට අවසර ලබා නොදීම වෙනස්කොට සැලකීමක් වේ. |
| ස්ත්‍රී පුරුෂ භාවය හඳුනාගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා Sex reassignment සැත්කම් අවශ්‍ය විය යුතුය. | ලිංගික අනන්‍යතාවය ලිංගික අවයව වලට වඩා බොහෝ දේ සමග සම්බන්ධ වේ. ලිංගය නැවත පැවරීමේ ශල්‍යකර්මයක් යනු සමහර සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්ට ඉන් ඉවත් වීමට අවශ්‍ය පසුබිම සකසන්නක් විය හැකි සංකීර්ණ ක්‍රියා පටිපාටියකි. එය ඔවුන්ගේ සැබෑ ලිංගභේදය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවිය යුතුය.. |
| ස්වාමිපුරුෂයා සහ භාර්යාව විවාහක වී ඇති නම් සහ ලිංගිකව හැසිරීමට අවශ්‍ය නැති භාර්යාවක් සමග සැමියා ලිංගිකව හැසිරෙයි නම්, එය දූෂණය කිරීමක් ලෙස සැලකිය යුතුය. | ලිංගිකව හැසිරීමට කැමැත්තක් නොමැති වීම ලිංගිකත්වයෙන් ලිංගික හිංසනය වෙන්කර හඳුනා ගැනීමට බලපාන සාධකයක් වේ. ලිංගිකව හැසිරීමට එකඟතාවක් නොමැති නම් එය ස්ත්‍රී දූෂණයක් ලෙස සැලකිය යුතුය. |

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ශිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.


facebook.com/BridgetoEquality

instagram.com/bridgetoequality2021

twitter.com/B2ECampaign

bridgetoequalitycampaign@protonmail.com